වැය ශීර්ෂ - 282

වාරිමාර්ග දෙපාර්තමේන්තුව

2024 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ

වැය ශීර්ෂ අංකය- 282

අන්තර්ගතය	පිටු අංක
පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය	1
1.1 හැඳින්වීම	
1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු	
1.3 ප්‍රධාන කාර්යයන්	
1.4 සංවිධාන සටහන	
1.5 දෙපාර්තමේන්තුව යටතේ ඇති ප්‍රධාන අංශ	
පරිච්ඡේදය 02 – ප්‍රගතිය හා ඉදිරි දැක්ම	13
2.1 විශේෂ ජයග්‍රහණ සහ ප්‍රගතිය	
2.2 අභියෝග	
2.3 ඉදිරි ඉලක්ක	
පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය	47
පරිච්ඡේදය 04 – කාර්ය සාධන දර්ශක	55
පරිච්ඡේදය 05- තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	55
පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ	56
පරිච්ඡේදය 07– අනුකූලතා වාර්තාව	64

පරිච්ඡේදය 01 : ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ජල සම්පත් සංවර්ධනය සඳහා වගකිවයුතු ප්‍රධාන ආයතනය වාරිමාර්ග දෙපාර්තමේන්තුවයි. විදේශීය හෝ වෙනත් බාහිර උපදේශන නොමැතිව ජල සම්පත් සම්බන්ධ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ශක්‍යතා අධ්‍යයනය, විමර්ශන, ක්‍රම සැලසුම්, සැලසුම් සහ ඉදිකිරීම් කටයුතු සිදු කරන එකම ආයතනය වාරිමාර්ග දෙපාර්තමේන්තුවයි.

මෙම දෙපාර්තමේන්තුව පොදු වැඩ දෙපාර්තමේන්තුවෙන් වෙන්ව වෙනම දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපිත කිරීම එවකට බ්‍රිතාන්‍ය ආන්ඩුකාරවරයාගේ නියමය පරිදී සිදුවී ඇති අතර 1900 මැයි 15 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා ලෙස ප්‍රථම වාරිමාර්ග අධ්‍යක්ෂවරයා පත් කර කාර්යාලය බලාත්මක කර ඇත. පැවති වාරිමාර්ග වැඩ, කුඹුරු සහ අනෙකුත් වාරි පහසුකම් සැපයෙන ඉඩම් සඳහා නීති ඇතුලත් ආඥා පනත් වෙනුවට 1906 අංක 16 දරණ වාරිමාර්ග ආඥා පනත ප්‍රකාශයට පත් කර එමගින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත බලතල පවරා දී ඇත.

මේ වන විට වගා ඉඩම් හෙක්ටයාර 323,786 කට වාරිමාර්ග පහසුකම් සපයන අතර 2030 වර්ෂය වන විට එම ප්‍රමාණය හෙක්ටයාර 350,000 දක්වා වැඩි කිරීමට සැලසුම් කර ඇත. එසේම ජලය හා සම්බන්ධව කටයුතු අනිකුත් රේඛීය ආයතන වන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, පළාත් පාලන ආයතන ආදී වූ පාර්ශවකරුවන් සමග සහයෝගයෙන් වැඩ කර අවශ්‍ය අවස්ථා වලදී තාක්ෂණික සේවා සැපයීම ද සිදු කරනු ලබයි.

ජාතියේ ආහාර සුරක්ෂිතතාවය වෙනුවෙන් අපගේ ප්‍රධාන ආහාරය වන සහල් නිපදවීම පිණිස වී වගාව සඳහා ජලය සම්පාදනය කරන අතරම ඒ ඒ ප්‍රදේශ වල අනෙකුත් අතිරේක බෝග වගාවන් ඇතුළු සියලු ජල අවශ්‍යතා සපුරාලීම පිණිස ප්‍රතිපත්ති, සැලසුම් හා වැඩසටහන් සකස් කිරීම වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබයි.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු

1.2.1 දැක්ම

“අහසින් වැටෙන එක දිය බිඳුවකුදු ලෝකෝපකාරයෙන් තොරව මුහුදට ගලා යා නොදෙනු” යන මහා පරාක්‍රමබාහු රජතුමාගේ පාඨය ගුරුතැන්හිලා, පරිසරයද සුරකිමින්, තිරසාර ආර්ථික හා සමාජ සංවර්ධනය සහතික කරනු සඳහා සෑම වැසි ජල බිඳුවක්ම පරිසර හිතකාමී ලෙස තිරසාර අයුරින් මිනිසාගේ යහපත සඳහා යොදා ගැනීමයි.

1.2.2 මෙහෙවර

කෘෂිකර්මයට සෘජුවමත්, පාරිසරික, ගෘහස්ත, කාර්මික හා විදුලිජනක අවශ්‍යතා සඳහා වක්‍රවත් අවශ්‍ය ජලය සැපයීම සඳහා සමාන්තර ආයතන සමඟ සහයෝගයෙන් රටේ සම්පත් භාවිතයට ගැනීම, සංවර්ධනය, සංරක්ෂණය, පාලනය, බෙදාහැරීම හා කළමනාකරණය මඟින් එම සම්පත් වලින් රටට උපරිම ප්‍රතිලාභයක් ලබාදීම.

1.2.3 බලතල පැවරී ඇති ප්‍රධාන නෛතික විධිවිධාන

- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව - ප්‍රතිශෝධිත මුද්‍රණය - 2021 පෙබරවාරි, 9 වන උපලේඛණය - III වන ලැයිස්තුව (සමගාමී ලැයිස්තුව) අර්ථ දැක්වීමට අනුව
- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43(1) සහ 46 (10(අ)) ප්‍රකාරව කැබිනට් අමාත්‍යවරුන් පත් කිරීම සහ විෂය සහ කාර්යයන් වෙන් කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් නිකුත් කරන ලද ගැසට් නිවේදනය
- 1994 අංක 13 දරණ වාරිමාර්ග (සංශෝධන) පනතේ 5 වන වගන්තිය අනුව
- 1946 අංක 32 දරණ වාරිමාර්ග ආඥා පනතේ V වන කොටසේ අංක 33 හා 34 වගන්ති අනුව
- 1955 අංක 22 දරණ ගංවතුර ආරක්ෂණ ආඥා පනතේ 3 (I), 5(I) හා 6 වගන්ති අනුව
- මුදල් රෙගුලාසි 788 අනුව
- 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදුකරණ ලද 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින්, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් කළ යුතු යැයි හඳුනාගන්නා ලද පලාත් එකකට වැඩි ගණනක් හරහා ගලා යන ගංගා හා සම්බන්ධ වාරිමාර්ග යෝජනා ක්‍රම හෝ අන්තර් පලාත් වාරිමාර්ග සහ ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රම වලට අදාළ සියලු වාරිමාර්ග වැඩ හා සම්බන්ධ ක්‍රමසම්පාදනය, ඒවා සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා නඩත්තු කිරීම ශ්‍රී ලංකා ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් ලෙස වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ඉටුකිරීමට බැඳී සිටී.

1.2.4 අරමුණු

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු පහත පරිදි වේ;

- පාරිසරික තිරසාරත්වය සහතික කරමින් වාරි ජල සම්පාදිත කෘෂිකර්මය, ජල විදුලි නිෂ්පාදනය, ගංවතුර ආරක්ෂණය, ගෘහස්ත ප්‍රයෝජනය, කාර්මික ප්‍රයෝජනය, ජල ජීවී වගාව සංවර්ධන උදෙසා භූමී සහ ජල සම්පත් සංවර්ධනය.
- වාරිමාර්ග හා ජල අපවහන ව්‍යාපෘතිවල ඇති වගා කළ හැකි ඉඩම් සඳහා උස්සාන වාරිමාර්ග පහසුකම් සැපයීම, ජල අපවහන පද්ධතීන් සැපයීම හා මුහුදු ජලය ගලා ඒම වැලැක්වීම.
- පානීය ජලය සඳහා පහසුකම් සැපයීම, ගංවතුර අවදානම ඇති ප්‍රදේශවලට ගංවතුර ආරක්ෂණ හා ජල අපවහන පහසුකම් සැපයීම.
- ග්‍රාමීය ජනයාගේ ගොවි ආදායම් වැඩි කිරීම තුළින් ඔවුන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සහ ග්‍රාමීය ප්‍රදේශවල දිළිඳුකම තුරන් කිරීම.
- තිරසාර කෘෂිකර්මාන්තය සහ වෙනත් භාවිතයන් සඳහා ජලය අරපිරිමැසුම්දායි වශයෙන් කළමනාකරණය කිරීම.
- විශාල, මධ්‍යම ප්‍රමාණයේ සහ අන්තර් පලාත් වාරිමාර්ග ව්‍යාපෘතීන් සඳහා ජලය සහ ඉඩම් සඳහා වූ ඵලදායීතා වර්ධනය.
- විශාල, මධ්‍යම ප්‍රමාණයේ සහ අන්තර් පලාත් වාරිමාර්ග පද්ධති සඳහා ඒකාබද්ධ ජලසම්පත් කළමනාකරණය සහ සහභාගීත්ව කළමනාකරණය.
- වාරිමාර්ග දෙපාර්තමේන්තුවට පවරා ඇති ගංගා ද්‍රෝණිවල ඒකාබද්ධ ජලසම්පත් කළමනාකරණය සහ සහභාගීත්ව කළමනාකරණය.

1.3 ප්‍රධාන කාර්යයන්

- පාරිසරික සාධක වලට ප්‍රමුඛතාවය දී ඉඩම් හා ජල සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම සඳහා ගංඟා ද්‍රෝණි සංවර්ධනය සම්බන්ධයෙන් ප්‍රධාන සැලසුම් සකස් කිරීම.

- වාරිමාර්ග, ජල විදුලිය සහ ගංවතුර පාලනය සඳහා වන නව ව්‍යාපෘති සඳහා සවිස්තර සැලසුම් සකස් කිරීම.

- නව හා පවතින ගොවිතැන් කළ හැකි ඉඩම් වල අස්වැන්න වැඩි කිරීම සඳහා ගුරුත්ව හා උස්සාන වාරිමාර්ග ක්‍රම යටතේ ජල සංරක්ෂණය, හැරවීම හා බෙදා හැරීම සිදු කිරීම සඳහා නව ව්‍යාපෘති ඉදිකිරීම සහ ගොවීන් පදිංචි කිරීමේ ව්‍යාපෘති සැකසීම.

- ජලාපවහන, ගංවතුර පාලන සහ ලවණ දිය බැහැර කිරීමේ ව්‍යාපෘති ඉදි කිරීම මගින් එම බලපෑම් ඇති ඉඩම් වල ගොවිතැන් කිරීමේ කටයුතු අනතුරකින් තොරව කරගෙන යාමට ඉඩ සැලසීම.

- ගංවතුරෙන් සිදුවන හානිය අවම කිරීම හෝ අවම කිරීම සඳහා ජලාපවහන හා ගංවතුර ආරක්ෂණ පහසුකම් සැපයීම.

- මධ්‍යම පරිමාණ හා ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම, ජලාපවහන හා ගංවතුර ආරක්ෂණ යෝජනා ක්‍රම, ලවණ ජලය බැහැර කිරීමේ යෝජනා ක්‍රම වල මෙහෙයුම් හා නඩත්තු කටයුතු, වැඩිදියුණු කිරීම් සහ පුනරුත්ථාපන කටයුතු කිරීම මගින් ප්‍රශස්ථ ජල කළමනාකරණයක් ප්‍රතිලාභීන්ගේ සහභාගීත්වය ලබා ගනිමින් ඉටු කිරීම. අන්තර් අංශ භාවිතය, ගෘහස්ථ හා කාර්මික භාවිතය සහ පාරිසරික අවශ්‍යතා සඳහා ද ජලය සැපයීම වෙනුවෙන් වාරිමාර්ග ජලාශ ඉදිකිරීම සහ සංරක්ෂණය කර පවත්වා ගැනීම.

- කෘෂිකාර්මික හා ගෘහස්ත පරිභෝජනයේ තිරසාර ජල සැපයුම සඳහා වේලි ඇතුළු ජල යටිතල පහසුකම් නඩත්තු කිරීම හා වැඩිදියුණු කිරීම.

- ජල සම්පත් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති සඳහා අවශ්‍ය කරන පර්යේෂණ ජල ශක්ති, ජල විද්‍යා, ඉංජිනේරු ද්‍රව්‍ය, ඉංජිනේරු භූවිද්‍යා, භූවිද්‍යාත්මක තොරතුරු, ඉඩම් පරිහරණ යන අංශ වල සිදු කිරීම.

- වාරිමාර්ග අංශයේ මානව සම්පත් ප්‍රශස්ථව උපයෝජනය සඳහා මානව සම්පත් සංවර්ධනය.


- රජයේ මූල්‍ය රෙගුලාසි වලට අනුකූලව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ විගණන පද්ධතිය, ගිණුම් වාර්තා කිරීම, මූල්‍ය කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම.

- ජල සම්පත් වැඩි දියුණු කිරීම, ඉංජිනේරුමය මූලික දැනුම, පස් වැඩ සහ කොන්ක්‍රීට් වැඩ වල තත්ත්වය පාලනය, ජල ශක්ති ආකෘති පරීක්ෂාවට ලක් කිරීම සහ ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම සම්බන්ධව රාජ්‍ය දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සංස්ථා සහ පොදු හා පෞද්ගලික ආයතන සඳහා උපදෙස් ලබා දීම.

- රටේ ආහාර සුරක්ෂිතතාවය වඩාත් තහවුරු කිරීම සඳහා වාරි ව්‍යාපාරයන්හී ඵලදායිතාවය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගෙන මහා වාරි හා මධ්‍ය වාරි ව්‍යාපාරයන්හී ඒකාබද්ධ හා සහභාගීත්ව වාරිමාර්ග කළමනාකරණ ක්‍රමවේද සංකල්පය මත ව්‍යාපාර කළමනාකාරණය සිදු කිරීම.


1.4 සංවිධාන සටහන

1.4.1 සංවිධාන සටහන - වාරිමාර්ග දෙපාර්තමේන්තුව




* නියමිත තනතුරක් නොවන අතර අවශ්‍යතාවය මත පදනම්ව අනුමත වාරිමාර්ග අධ්‍යක්ෂ තනතුරු 36 තුල පත් කිරීම සිදු කරයි.


1.4.2 සංවිධාන සටහන - කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය




1.4.3 සංවිධාන සටහන - ප්‍රාදේශීය වාර්මාර්ග ඉංජිනේරු කාර්යාලය



1.4.4 සංවිධාන සටහන - යාන්ත්‍රික අංශය



1.4.5 සංවිධාන සටහන - යාන්ත්‍රික වැඩපොල



වගුව 1: සංවිධාන සටහන සඳහා සංක්ෂිප්තයන්

කෙටි යෙදුම	සටහන	වගකීම් දරන ක්ෂේත්‍රය
වා.අ.ජ.	වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්	සමස්ත කාර්යයන් : ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, සමස්ත අධීක්ෂණය සහ කළමනාකරණය, බාහිර ආයතන සමඟ සම්බන්ධීකරණය, කාර්ය මණ්ඩලය සහ ප්‍රතිපාදන මෙහෙයවීම, පුහුණුව සහ පොදු අවශ්‍යතා වෙනුවෙන් කටයුතු කිරීම තාක්ෂණික කාර්යයන්: විශාල පරිමාණයේ ව්‍යාපෘති සඳහා ක්‍රමසැලසුම් කිරීම, විමර්ශනය, සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම,විශාල හා මධ්‍යම ප්‍රමාණයේ වැඩකටයුතුවල මෙහෙයුම්, වැඩිදියුණු කිරීම් සහ ජල කළමනාකරණය සහ සැලසුම් කිරීම, විමර්ශනය, සැලසුම් කිරීම සහ තත්ත්ව පාලනය සඳහා උපදේශන සේවා ලබා දීම
අති.වා.අ.ජ (වී,සැ.හා සැ.)	අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් (විමර්ශන, ක්‍රම සැලසුම් හා සැලසුම්)	වාරිමාර්ග ව්‍යාපෘති සම්බන්ධයෙන් වන විමර්ශන සිදු කිරීම, ක්‍රම සැලසුම් සකස් කිරීම සහ සැලසුම් කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන ශාඛා අධීක්ෂණය, පරිපාලනය සහ සම්බන්ධීකරණය සිදු කිරීම.
අති.වා.අ.ජ (ක්‍රම. කළ.)	අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රම කළමනාකරණ)	ගුරුත්ව වාරි යෝජනා ක්‍රමවල මෙහෙයුම්,නඩත්තු කිරීම, ජල කළමනාකරණය සහ ඵලදායිතාව වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන ශාඛා අධීක්ෂණය, පරිපාලනය සහ සම්බන්ධීකරණය.
අති.වා.අ.ජ (ඉදි. හා සං.)	අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් (ඉදිකිරීම් හා සංවර්ධන)	ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ඉදිකිරීම සම්බන්ධයෙන් කටයුතු කරන ශාඛා අධීක්ෂණය, පරිපාලනය සහ සම්බන්ධීකරණය.
අති.වා.අ.ජ (ගංගා. කළ.)	අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් (ගංගාධාර කලමනාකරණ)	ජලාපවහනය, ගංවතුර පාලනය සහ ගංගාධාර කළමනාකරණය සම්බන්ධයෙන් කටයුතු කරන ශාඛා අධීක්ෂණය, පරිපාලනය සහ සම්බන්ධීකරණය.
අති. අ.ජ (පාලන)	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන)	ප්‍රධාන කාර්යාලයට සහ දිවයින පුරා පිහිටා ඇති ප්‍රාදේශීය කාර්යාලවලට අනුයුක්ත කාර්ය මණ්ඩලයේ සියලුම පරිපාලන කටයුතු අධීක්ෂණය සහ සම්බන්ධීකරණය.
ප්‍ර.මූ.නි.	ප්‍රධාන මුල්‍ය නිලධාරී	ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහ අනෙකුත් අදාළ නීතිරීති සහ රෙගුලාසි වලින් පැවරී ඇති බලතල අනුව ගණන්දීමේ නිලධාරියා ලෙස රාජකාරි ඉටු කිරීම සඳහා සහය වීම.
වා.අ.(ව්‍යා.සැ. හා නි.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ව්‍යාපෘති සැලසුම් සහ නිර්මාණ)	නව ජල සම්පත් සංවර්ධන යෝජනා හඳුනා ගැනීම,ජල සම්පත් බහු විධ භාවිතය සඳහා ශක්‍යතා පරීක්ෂා කිරීම, සැලසුම් කිරීම, විස්තරාත්මක සැලසුම් සකස් කිරීම සහ ඉදිකිරීම් සඳහා අවශ්‍ය සැලසුම් සැපයීම.
වා.අ. (ජල.ස.සැ.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ජල සම්පත් සැලසුම්)	සමාජ, ආර්ථික සහ පාරිසරික සංවර්ධන ඉලක්ක දිගුකාලීනව සපුරා ගැනීම සඳහා අවශ්‍ය වන ජාතික ජල සම්පත් සැලැස්ම සකස් කිරීම, වැඩිදියුණු කිරීම සහ යාවත්කාලීන කිරීම.
වා.අ. (ඉං.භූ.වී.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ඉංජිනේරු භූ විද්‍යා)	ප්‍රධාන හා මධ්‍යම වාරිමාර්ග ව්‍යාපෘති සැලසුම් කරණය සඳහා අවශ්‍ය භූගත පරීක්ෂණ සහ අත්තිවාරම් වැඩිදියුණු කිරීම සඳහා තාක්ෂණික උපක්‍රම යෙදීම. ගොඩබිම සහ වෙරළ ආශ්‍රිතව විමර්ශන සඳහා උපදේශන සේවා සැපයීම, දැනට භාවිතයේ පවතින නිර්මිත වල කාන්දුවීම් සහ ස්ථායීතාවය ආශ්‍රිත ගැටළු සඳහා විසඳුම් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

කෙටි යෙදුම	සටහන	වගකීම් දරන ක්ෂේත්‍රය
වා.අ (ඉං.ද්‍රව්‍ය)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ඉංජිනේරු ද්‍රව්‍ය)	ප්‍රධාන හා මධ්‍යම වාරිමාර්ග ව්‍යාපෘති සඳහා ඉදිකිරීම් ද්‍රව්‍ය පරීක්ෂණ කිරීම, පස් වලින් ඉදි කරන වේලි සැලසුම් කිරීම සහ ඉදිකිරීම් ස්ථානවල තත්ත්ව විමර්ශනය සහතික කිරීම. විමර්ශනය කිරීම, සිවිල් ඉංජිනේරු ඉදිකිරීම් කටයුතුවල ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවට මෙන්ම අනෙකුත් අවශ්‍ය ආයතනවලට සේවා සැපයීම.
වා.අ. (තො.ස.තා/භූ. තො.තා)	වාරිමාර්ග අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ / භූගෝලීය තොරතුරු තාක්ෂණ)	වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සියලුම අංශ , ශාඛා, කලාප සහ කොට්ඨාශ සඳහා පරිගණක සහ තොරතුරු තාක්ෂණය සම්බන්ධ සේවාවන් සැපයීම සහ අවශ්‍ය අංශ සහ ප්‍රාදේශීය කාර්යාල සඳහා භූගෝලීය තොරතුරු තාක්ෂණික සේවා,සහාය සහ පුහුණුව ලබා දීම.
වා. අ (ජල වී සහ ආපදා . කළ.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ජල විද්‍යා සහ ආපදා කළමනාකරන)	ජල සම්පත් සංවර්ධනය සහ ගංවතුර පුරෝකථනය සඳහා ජල විද්‍යාත්මක සහ කාලගුණික දත්ත රැස් කිරීම, සැකසීම සහ බෙදා හැරීම, ප්‍රධාන ගංගා සඳහා පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සමඟ සම්බන්ධීකරණය කිරීම.
වා.අ. (ජල ශක්ති)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ජල ශක්ති)	වාරිමාර්ග ව්‍යාපෘතිවල ආදර්ශ අධ්‍යයනයන් සිදු කිරීම, විෂයය පිළිබඳ ගැටළු සම්බන්ධයෙන් අවශ්‍ය ආයතනවලට උපදේශන සේවා සැපයීම සහ උපකරණ ඒකකය පවත්වාගෙන යාම.
වා.අ (ක්‍ර. සැ. සහ සැ.මධ්‍යම)	වාරිමාර්ග අධ්‍යක්ෂ- (ක්‍රම සැලසුම් සහ සැලසුම් -මධ්‍යම)	මහනුවර, කුරුණෑගල, පුත්තලම සහ අම්පාර යන කලාප වල මධ්‍යම හා කුඩා වාරිමාර්ග ව්‍යාපෘතිවල ශක්‍යතා අධ්‍යයනය, ක්‍රම සැලසුම් සහ සැලසුම් කටයුතු සිදු කිරීම.
වා.අ. (ක්‍ර. සැ. සහ සැ - ඌව)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ක්‍රම සැලසුම් සහ සැලසුම් - ඌව කලාපය)	බදුල්ල, මොණරාගල, මඩකලපුව සහ හම්බන්තොට කලාප වල මධ්‍යම හා කුඩා වාරිමාර්ග ව්‍යාපෘතිවල ශක්‍යතා අධ්‍යයනය, සැලසුම් සහ සැලසුම් කටයුතු.
වා. අ (ක්‍ර. සැ. සහ සැ - උ.හා උ.මැද)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ක්‍රම සැලසුම් සහ සැලසුම් - උතුරු හා උතුරු මැද කලාපය)	අනුරාධපුර, මන්නාරම, පොළොන්නරුව සහ ත්‍රිකුණාමලය යන කලාප වල මධ්‍යම හා කුඩා වාරිමාර්ග ව්‍යාපෘතිවල ශක්‍යතා අධ්‍යයනය, සැලසුම් සහ සැලසුම් කටයුතු.
අධ්‍ය (ඉ. පරි.)	අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ)	වාරිමාර්ග සහ අනෙකුත් සංවර්ධන ව්‍යාපෘති වල ඉඩම් පරිහරණය තීරණය කිරීම සඳහා ගුණාත්මක හා ප්‍රමාණාත්මක විද්‍යාත්මක තොරතුරු සැපයීම.
වා.අ (වී.ඉදි.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (විශාල ඉදි කිරීම්)	මහා පරිමාණ වාරිමාර්ග හා ජනාවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම.
වා. අ (ප්‍රා.සං.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ප්‍රාදේශීය සංවර්ධන)	මධ්‍යම පරිමාණ වාරිමාර්ග ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම.
වා.අ. (භෞ.ස.ක.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (භෞතික සම්පත් කළමනාකරණ)	දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශයේ අයවැය ප්‍රතිපාදන නිසි පරිදි යොදා ගනිමින් යන්ත්‍රෝපකරණ සහ වාහන හැර අනෙකුත් සියලුම වත්කම් කළමනාකරණය කිරීම සහ සියලුම ගුරුත්ව වාරිමාර්ග ව්‍යාපාර නඩත්තු කිරීම සහ වැඩිදියුණු කිරීම.
වා.අ. (ජල. ක.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ජල කළමනාකරණ)	ජල ඒකකයකින් සහ ඉඩම් ඒකකයකින් උපරිම ඵලදායිතාවයක් ලබා ගැනීමට සහ ගොවි ජනතාවගේ ආදායම ඉහළ නැංවීම සඳහා ගොවීන්ගේ සහභාගීත්වයෙන් වාරිමාර්ග පද්ධතිවල කාර්යක්ෂමතාවයට, ඵලදායීතාවයට සහ තිරසාර කළමනාකරණයට අවශ්‍ය පහසුකම් සැලසීම.

කෙටි යෙදුම	සටහන	වගකීම් දරන ක්ෂේත්‍රය
වා.අ. (ගං.ක හා පා. අ.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ගංගාධාර කළමනාකරණ හා පාරිසරික අධ්‍යයන)	භෞතික හා පාරිසරික සමතුලිතතාවය පවත්වා ගැනීම සඳහා සියලු පාර්ශ්වයන්ගේ සම්බන්ධීකරණය සහ සහභාගීත්වය ඇතිව ගංගාධාර සංරක්ෂණ කටයුතු සඳහා පහසුකම් සැලසීම. දෙපාර්තමේන්තුව මඟින් ඉටුකල යුතු පාරිසරික අධ්‍යයනයට අදාල කටයුතු සඳහා මැදිහත්වී ක්‍රියාත්මක කිරීම.
වා.අ (ජලා. හා ගං. පද්.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ජලාපවහන හා ගංවතුර පද්ධති)	පහත් බිම්වල ජලාපවහන සහ ලවණ ජලය බැහැර කිරීමේ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම මගින් කුඹුරු වගා කිරීම සඳහා අවශ්‍ය පරිසරය සකස් කිරීම, ගංවතුර ආරක්ෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මගින් මිනිස් ජීවිත, පොදු සහ පෞද්ගලික දේපළ සහ පරිසරය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට උපදෙස් ලබා දීම.
වා. අ (වැ.කළ.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (වැඩසටහන් කළමනාකරණ)	ප්‍රාග්ධන අයවැය සැලසුම් කිරීම, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කිරීම, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා සහාය වීම, ප්‍රගතිය වාර්තා කිරීම සහ අනෙකුත් වාර්ෂික හා කාර්තුමය වාර්තා ඉදිරිපත් කිරීම
වා.අ (කො.හා ප්‍ර.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (කොන්ත්‍රාත් හා ප්‍රසම්පාදන)	වැඩ, භාණ්ඩ හා සේවා සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම, ප්‍රසම්පාදන ක්‍රියාවලිය දෙපාර්තමේන්තුව තුල නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම සහ ප්‍රමිතීන් පවත්වා ගෙන යාම සඳහා ක්‍රියා පටිපාටි යාවත්කාලීන කිරීම.
වා.අ (පුහුණු / ප.ස. සහ ක්‍ර.ප්‍ර.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (පුහුණු / පර්යේෂණ සහාය සහ ක්‍රමවේද ප්‍රවර්ධන)	දෙපාර්තමේන්තුවේ සියලුම කාර්ය මණ්ඩල වල කුසලතා වර්ධනය කිරීම සඳහා අවශ්‍ය පුහුණුව සැලසීම සහ සම්බන්ධීකරණය කිරීම, ප්‍රධාන කාර්යාලය, කලාප සහ ගල්ගමුව වාරිමාර්ග පුහුණු ආයතනයේ පුහුණු කටයුතු සම්බන්ධීකරණය, සියලුම කාණ්ඩවල සේවකයින් බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියට අනුව බඳවා ගැනීමේ විභාග සහ කාර්යක්ෂමතා කඩයිම් විභාග පැවැත්වීමට අවශ්‍ය කටයුතු සම්පාදනය සහ පැවැත්වීම. දෙපාර්තමේන්තුවේ සියලුම සේවාවන් සහ ක්‍රියාවලි වැඩිදියුණු කිරීමට අදාළව සහ අනෙකුත් විශේෂ ක්ෂේත්‍රවල පර්යේෂණ ප්‍රවේශය තුළින් ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම සඳහා සහාය ලබා දීම.
වා.අ. (වැ.පො.හා ගොඩ.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (වැඩ පොදු හා ගොඩනැගිලි සේවා)	පාර්ලිමේන්තු උපදේශන කමිටු කටයුතු, මහජන පෙත්සම් යනාදී විවිධ කාරණා සම්බන්ධයෙන් කටයුතු කිරීම, රත්මලානේ පිහිටි නිල නිවාස,ප්‍රධාන කාර්යාලය, අංක 34 පරිශ්‍රය පරිපාලනය, නඩත්තු කිරීම, ඉදිකිරීම්, වැඩිදියුණු කිරීම් සහ සම්පත් වෙන් කිරීමේ කටයුතු සිදු කිරීම.
වා.අ. (ඉං.වී.තා / වා.ඵ.ප්‍ර.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (ඉංජිනේරු, විද්‍යා සහ තාක්ෂණික සේවා / වාරිමාර්ග ඵලදායීතා ප්‍රවර්ධන)	ඉංජිනේරු, විද්‍යාත්මක, ගණකාධිකාරී, පරිපාලන සහ ඉංජිනේරු සහකාර සේවයේ පරිපාලන කටයුතු සිදු කිරීම සහ අධීක්ෂණය. වප් හවුල ක්‍රියාත්මක වාරිමාර්ග ව්‍යාපාර වල සහභාගීත්ව කළමනාකරණ ප්‍රවේශය සමඟින් වාරි කෘෂිකර්මාන්තයේ ඵලදායීතාව ඉහළ නැංවීම සහ වප් හවුල වැඩසටහන කළමනාකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම.
වා.අ. (වා.අ.ආ.)	වාරිමාර්ග අධ්‍යක්ෂ (වාරිමාර්ග අභ්‍යාස ආයතනය)	ඉංජිනේරු සහකාරවරුන් සඳහා වාරි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වීම, පුහුණු අංශයේ ඉල්ලීම මත සියලුම සේවා කාණ්ඩ සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියට අනුව සේවා පුහුණු වැඩසටහන් පැවැත්වීම, කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම සහ දෙපාර්තමේන්තුවේ සියලුම කාර්ය මණ්ඩල වල කුසලතා වර්ධනය කිරීම සඳහා අවශ්‍ය පුහුණුව සැලසීම.

කෙටි යෙදුම	සටහන	වගකීම් දරන ක්ෂේත්‍රය
ක.වා.අධ්‍ය.	කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ	වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් වෙනුවෙන් කලාපය තුල දෙපාර්තමේන්තුව නියෝජනය කිරීම, සැලසුම් ප්‍රමිතීන් සහ ඉදිකිරීම් වැඩ වල ගුණාත්මකභාවය සහතික කරමින් කලාපයේ පරිපාලනය කිරීම, නිසි ජල කළමනාකරණය සහතික කරමින් කලාපයේ වාරිමාර්ග කටයුතු මෙහෙයවීම සහ නඩත්තු කිරීම, වත්කම් නඩත්තු කිරීම සහ ආරක්ෂා කිරීම, අතිරේක වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගේ මහපෙන්වීම යටතේ සහ දිස්ත්‍රික් මට්ටමේ අවශ්‍යතා සමඟ සාකච්ඡා කර කලාපයේ වාරිමාර්ග කටයුතු සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ අයවැය සකස් කිරීම, තාක්ෂණික පාලනය සඳහා ප්‍රධාන හෝ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු සහ අනෙකුත් කාර්ය මණ්ඩලයේ සහාය ඇතිව ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම, මූල්‍ය පාලනය සඳහා ගණකාධිකාරී සහ කාර්ය මණ්ඩලය මෙහෙයවීම. කාර්ය මණ්ඩල පාලනය සඳහා පරිපාලන නිලධාරී සහ කාර්ය මණ්ඩලය මෙහෙයවීම, ස්ථාවරයන් සහ මාර්ගෝපදේශ අනුව සුළු හා මධ්‍යම පරිමාණ වාරිමාර්ග වැඩ කටයුතු විමර්ශනය කිරීම, ක්‍රම සැලසුම් හා සැලසුම් කිරීම සහ ඇස්තමේන්තු පිළියෙළ කිරීම. නිවැරදි ක්‍රියා පටිපාටිය අනුගමනය කරමින් ඒකක ගාස්තු ගණනය කිරීම, ප්‍රධාන කාර්යාලයට අවශ්‍ය විමර්ශන, ක්‍රම සැලසුම් සහ සැලසුම් කාර්යයන් ක්‍රියාත්මක කිරීම. භෞතික හා මූල්‍ය ප්‍රගතිය වාර්තා කිරීම, වා.අ (වී.ඉදි) වෙනුවෙන් විශාල ඉදිකිරීම් අංශය මගින් ක්‍රියාත්මක ප්‍රධාන වාරිමාර්ග ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සමස්ත අධීක්ෂණය, ක්‍රියාත්මක ප්‍රධාන වාරිමාර්ග ව්‍යාපෘති සම්බන්ධව දිස්ත්‍රික්කයේ අනිකුත් ආයතන වෙත තොරතුරු සැපයීම, කලාපය තුළ පිහිටා ඇති ක්ෂේත්‍ර යාන්ත්‍රික වැඩපළවල් කළමනාකරණය කිරීම.
අධ්‍යක්ෂ (පාලන)	අධ්‍යක්ෂ (පාලන)	පරිපාලන කටයුතු සඳහා අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන) ට සහාය වීම.
යා. අධ්‍ය. (ප්‍ර.කා. සහ ද.)	අධ්‍යක්ෂ යාන්ත්‍රික (ප්‍රධාන කාර්යාලය සහ දකුණ)	ප්‍රධාන කාර්යාලය, කොළඹ, ගාල්ල, හම්බන්තොට සහ මොණරාගල යන කලාපවලට අයත් සියලුම වාහන, යන්ත්‍රෝපකරණ සහ වාරි නිර්මිත හා සම්බන්ධ යාන්ත්‍රික ව්‍යුහයන් නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම.
යා. අධ්‍ය. (මධ්‍යම)	අධ්‍යක්ෂ යාන්ත්‍රික (මධ්‍යම)	මහනුවර, කුරුණෑගල, පුත්තලම, බදුල්ල, අම්පාර සහ මඩකලපුව යන කලාපවලට අයත් සියලුම වාහන, යන්ත්‍රෝපකරණ සහ වාරි නිර්මිත හා සම්බන්ධ යාන්ත්‍රික ව්‍යුහයන් නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම.
යා. අධ්‍ය. (උතුරු මැද)	අධ්‍යක්ෂ යාන්ත්‍රික (උතුරු මැද)	අනුරාධපුර, පොළොන්නරුව, මන්නාරම සහ ත්‍රිකුණාමලය යන කලාපවලට අයත් සියලුම වාහන, යන්ත්‍රෝපකරණ සහ වාරි නිර්මිත හා සම්බන්ධ යාන්ත්‍රික ව්‍යුහයන් නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම.
ප්‍ර.ග. (මූල්‍ය)	ප්‍රධාන ගණකාධිකාරී (මූල්‍ය)	ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාලයේ මූල්‍ය කටයුතු අධීක්ෂණය සඳහා ප්‍රධාන මුල්‍ය නිලධාරීට සහාය වීම.
ප්‍ර.ග. (ගිණුම් හා ඇස්.)	ප්‍රධාන ගණකාධිකාරී (ගිණුම් හා ඇස්තමේන්තු)	වාර්ෂික ඇස්තමේන්තු, ගිණුම්, වියදම් වාර්තා සහ අනෙකුත් වාර්තා සකස් කිරීම, දෙපාර්තමේන්තු සහ අනෙකුත් දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශ යටතේ ලැබෙන ප්‍රතිපාදන පාලනය සහ අධීක්ෂණය, මාසික වියදම් වාර්තා සහ අනෙකුත් වාර්තා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම.

කෙටි යෙදුම	සටහන	වගකීම් දරන ක්ෂේත්‍රය
ප්‍රා.වා.ඉංජී.	ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු	ප්‍රාදේශීය මට්ටමේ අවශ්‍යතා සමඟ සම්බන්ධීකරණයෙන් ප්‍රාදේශීයව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම්වල සමස්ත අධීක්ෂණය සහ කළමනාකරණය සිදු කිරීම, වාරිමාර්ග කටයුතු ක්‍රියාත්මක කිරීමේදී ප්‍රාදේශීයව තාක්ෂණික, මූල්‍ය සහ පරිපාලන කටයුතු පාලනය කිරීම, නිසි ජල කළමනාකරණයක් සහතික කරමින් කොට්ඨාශයේ වාරිමාර්ග කටයුතු මෙහෙයවීම සහ නඩත්තු කිරීම සඳහා කලාප වාරිමාර්ග අධ්‍යක්ෂකට සහාය වීම; සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් වත්කම් නඩත්තු කිරීම සහ ආරක්ෂාව, කලාප වාරිමාර්ග අධ්‍යක්ෂකගේ මහපෙන්වීම යටතේ සහ ප්‍රාදේශීය අවශ්‍යතා සැලකිල්ලට ගෙන වාරිමාර්ග කටයුතු සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ අයවැය සැකසීමේදී කලාප වාරිමාර්ග අධ්‍යක්ෂකට සහාය වීම, අනුමත භෞතික හා මූල්‍ය වැඩසටහන්, සැලසුම් සහ ඉදිකිරීම් සැලසුම් අනුව කොට්ඨාශයේ වාරිමාර්ග වැඩ ඉදිකිරීමේ කටයුතු ගුණාත්මක බව සහතික කරමින් ක්‍රියාත්මක කිරීම, ස්ථාවරයන් සහ මාර්ගෝපදේශ අනුව සුළු හා මධ්‍යම පරිමාණ වාරිමාර්ග වැඩ කටයුතු විමර්ශනය කිරීම, ක්‍රම සැලසුම් හා සැලසුම් කිරීම සහ ඇස්තමේන්තු පිළියෙළ කිරීම, අනුමත ක්‍රියා පටිපාටිය අනුගමනය කරමින් අවශ්‍ය අවස්ථාවල ඒකක ගාස්තු සකස් කිරීම, කලාප වාරිමාර්ග අධ්‍යක්ෂක ගේ මහපෙන්වීම යටතේ සහ දෙපාර්තමේන්තු ක්‍රියා පටිපාටි සහ ප්‍රමිතීන්ට අනුව බාහිර ආයතනවල ව්‍යාපෘතිවල වාරිමාර්ග සංරචක ක්‍රියාත්මක කිරීම.

1.5 දෙපාර්තමේන්තුව යටතේ ඇති ප්‍රධාන අංශ


1 විමර්ශන,ක්‍රම සැලසුම් සහ සැලසුම් අංශය
2 ඉදිකිරීම් සහ සංවර්ධන අංශය
3 ක්‍රම කළමනාකරණ අංශය
4 ගංගාධාර කළමනාකරණ අංශය
5 පාලන අංශය
6 මූල්‍ය අංශය

මීට අමතරව පහත සඳහන් අංශයන් වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්ගේ සෘජු අධීක්ෂණය යටතේ පවතී.

1 වැඩසටහන් කළමනාකරණ අංශය
2 කොන්ත්‍රාත් සහ ප්‍රසම්පාදන අංශය
3 අභ්‍යන්තර විගණන අංශය
4 පුහුණු , පර්යේෂණ සහාය සහ ක්‍රමවේද ප්‍රවර්ධන අංශය
5 වැඩ පොදු හා ගොඩනැගිලි අංශය
6 යන්ත්‍ර සහ යාන්ත්‍රික වැඩපල අංශය
7 වාරිමාර්ග අභ්‍යාස ආයතනය - ගල්ගමුව

වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සහයට කුඩා කාර්ය මණ්ඩලයක් සිටින අතර, ඔවුන් වැඩකටයුතු කළමනාකරණය සහ සම්බන්ධීකරණය කරනු ලබයි. මෙයට අමතරව අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම් සහ වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස නිල බලයෙන් සහභාගි විය යුතු රැස්වීම් වලට අදාළ ලියකියවිලි පවත්වාගෙන යාම සිදු කරනු ලබයි.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ වන කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාල, ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල හා යාන්ත්‍රික කාර්යාල ඇතුළු ප්‍රාදේශීය කාර්යාලයන්හි පිහිටීම



පරිච්ඡේදය 02 : ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 විශේෂ ජයග්‍රහණ සහ ප්‍රගතිය

- වෙනත් වසරවලට සාපේක්ෂව වැඩි ප්‍රතිපාදන ප්‍රමාණයක් වාරිමාර්ග දෙපාර්තමේන්තුව (282 වැය ශීර්ෂය) සඳහා 2024 වර්ෂයේදී වෙන්කර තිබූ අතර එයින් මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා ලද රු.මි. 6,955.5 ක ප්‍රතිපාදන යොදාගනිමින් 93% ක භෞතික ප්‍රගතියක්ද 92% ක මූල්‍ය ප්‍රගතියක්ද, සංවර්ධන ව්‍යාපෘති සඳහා ලද රු.මි. 16,474 ප්‍රතිපාදන යොදාගනිමින් 44% ක භෞතික ප්‍රගතියක්ද 41% ක මූල්‍ය ප්‍රගතියක්ද අත්කර ගැනීමට හැකිවිය.

2.1.1 විමර්ශන,ක්‍රම සැලසුම් සහ සැලසුම් අංශය

- පාරිසරික අධ්‍යයන අංශය මගින් මුන්දෙනි ආරු ගංගා ද්‍රෝණි සංවර්ධන ව්‍යාපෘතියෙහි පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනය වන මධ්‍යම පරිසර අධිකාරිය වෙත ඉදිරිපත් කර ඇති අතර පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව, මධ්‍යම පරිසර අධිකාරිය විසින් මහජනතාවට අදහස් දැක්වීම සඳහා විවෘත කර ඇත. එමෙන්ම ගල්ගේකණ්ඩිය වැව් ව්‍යාපෘතියෙහි මූලික පාරිසරික අධ්‍යයන වාර්තාව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ව්‍යාපෘති අනුමත නියෝජිතායතනය වෙත 2024 ඔක්තෝම්බර් මාසයේදී ඉදිරිපත් කර ඇත.

- වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අදහස් සහ අනුමැතිය ලබා දීම සඳහා ඉදිරිපත් කරන ලද විවිධ රාජ්‍ය සහ පෞද්ගලික සංවර්ධන ව්‍යාපෘති වල (පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති, හෝටල් ව්‍යාපෘති ආදිය) පාරිසරික බලපෑම් ඇගයීම් සහ මූලික පාරිසරික අධ්‍යයන වාර්තා 28 ක් ඇගයීමට ලක් කර ඇත.

- කුඩා ජල විදුලි ව්‍යාපෘති 27 ක් ඇගයීමට ලක් කර ඊට අදාළ නිර්දේශයන් ව්‍යාපෘති අනුමත කරන ආයතන වෙත හෝ ව්‍යාපෘති යෝජකයන් වෙත ඉදිරිපත් කර ඇත. ඒ අතරින් ව්‍යාපෘති 8ක් සඳහා අනුමැතිය සහ ව්‍යාපෘති 2ක් සඳහා මූලික එකඟතාව ප්‍රදානය කරන ලදී.

- වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද සූර්ය බලශක්ති ව්‍යාපෘති වාර්තා 16ක් ඇගයීමට ලක් කර ඊට අදාළ අනුමත කිරීම් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත ලබා දී ඇති අතර විදුලි සම්ප්‍රේෂණ මාර්ග ව්‍යාපෘති 2ක් ඇගයීමට ලක් කර කොන්දේසි සහිත අනුමැතිය ලබා දී ඇත.

- හෝටල් ව්‍යාපෘති 50 ක් ඇගයීමට ලක් කර වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිර්දේශ හෝ අදහස් ලබා දී ඇත.

- වැව්/අමුණුවල රොන්මඩ ඉවත් කිරීම සඳහා මාර්ගෝපදේශයක් වාරිමාර්ග අධ්‍යක්ෂ (භෞතික සම්පත් කළමනාකරණ සහ සියලු කලාප) ගේ මූලිකත්වයෙන් යුතුව සකස් කර අදහස් සහ යෝජනා ලබා ගැනීම සිදු කරන ලද අතර ගංගා වැලි කැණීම් බලපත්‍ර සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිර්දේශ නිකුත් කිරීම සඳහා සියළු වාරිමාර්ග අධ්‍යක්ෂ (කලාප) සමඟ මාර්ගෝපදේශයක් සකස් කර බෙදා හැර ඇත. එමෙන්ම විගණන කමිටු රැස්වීම්වලදී ගනු ලැබූ තීරණයට අනුව රජයේ ඉඩම්වල ඛනිජ ලවණ අත්පත් කර ගැනීමේ ගාස්තු (සේවා / නිෂ්පාදන ගාස්තු) එකතු කිරීම ආරම්භ කරන ලදී.

- කුඩා ජල විදුලි ව්‍යාපෘති අනුමත කිරීම සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය (SOP) සඳහා වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමැතිය ලබා දී ඇත.

- නැඟෙනහිර පළාතේ ඉඩම් පදනම් කරගත් වැලි ගොඩදැමීමේ ව්‍යාපෘති 4ක්, දකුණු පළාතේ ඉඩම් ආශ්‍රිත වැලි ගොඩදැමීමේ ව්‍යාපෘති 5ක් සහ බස්නාහිර පළාතේ ඉඩම් පදනම් කරගත් වැලි ගොඩදැමීමේ ව්‍යාපෘති 1ක් සඳහා අනුමැතිය ලබා දී ඇති අතර වැව් පතුල් වලින් රොන්මඩ ඉවත් කිරීම සහ මැටි/පස් ඉවත් කිරීම සඳහා අනුමැතීන් 07 ක් පාරිසරික අධ්‍යන අංශය මගින් ලබා දී ඇත. (නාගදීප වැව, රොට්ට වැව, නාච්චදුව වැව, නවකිරි වැව, මොරවිල් ආරු, පල්ලිඅඩියාන්, මහ

අළුත්ගම ආර). මෙම අනුමැතීන් ලබා දුන්න ද 2024 වර්ෂය තුල දී කිසිදු රොන්මඩ ඉවත් කිරීමක් හෝ මැටි/පස් ඉවත් කිරීමක් සිදු කර නොමැත.

- ගංහා වැලි කැණීම් සඳහා බලපත්‍ර ලබා දීමට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යංශයෙන් සිදු කරන ලද ඉල්ලීම් වලින් 470 ක් සඳහා පාරිසරික අධ්‍යන අංශය මගින් පහත පරිදි නිර්දේශ ලබා දී ඇත.

අනු අංකය	වාරිමාර්ග කලාපය	වාරිමාර්ග නිර්දේශ ලබා දුන් සංඛ්‍යාව
1	අනුරාධපුරය	57
2	කොළඹ	135
3	ත්‍රිකුණාමලය	02
4	මඩකලපුව	21
5	පුත්තලම	17
6	මොණරාගල	24
7	මන්නාරම	01
8	හම්බන්තොට	01
9	පොළොන්නරුව	17
10	මහනුවර	51
11	කුරුණෑගල	29
12	අම්පාර	110
13	බදුල්ල	05
14	ගාල්ල	0

ගංහා වැලි සඳහා මසකට නිර්දේශ කර ඇති උපරිම වැලි කියුබ් සංඛ්‍යාව කියුබ් 30ක් වන අතර, සමහර අවස්ථා වලදී විවිධ හේතූන් මත මෙම උපරිම ප්‍රමාණයට වඩා අඩුවෙන් ද වැලි කැණීම් සඳහා නිර්දේශ නිකුත් කර ඇත.

- බොල්ගොඩ පරිසර ආරක්ෂණ ප්‍රදේශය තුළ ගේබියන් බිත්ති (ජැටි) ඉදිකිරීම සඳහා මාර්ගෝපදේශ සකස් කර බොල්ගොඩ ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීම සඳහා බොල්ගොඩ පරිසර ආරක්ෂණ ප්‍රදේශ කළමනාකරණ කමිටුවෙන් අනුමැතිය ලබා ගන්නා ලදී.

- වාරිමාර්ග දෙපාර්තමේන්තුව නියෝජනය කරමින්, පාරිසරික අධ්‍යන අංශය මගින් රැස්වීම් 126ක් (විෂයගත කිරීම, තාක්ෂණික ඇගයීම්, වැඩමුළු ආදිය) සහ ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණ 46ක් අධීක්ෂණය සහ ඇගයීම් සඳහා සිදු කරන ලදී. මධ්‍යම පරිසර අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, වෙරළ සංරක්ෂණ හා සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය, වනජීවී දෙපාර්තමේන්තුව වැනි අනෙකුත් අදාළ ආයතන සමඟ සහයෝගයෙන් විවිධ වර්ගයේ සංවර්ධන ව්‍යාපෘති සඳහා නිර්දේශ සහ අනුමැතිය නිකුත් කිරීම පිණිස වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පාරිසරික අධ්‍යයන අංශය කටයුතු කරන ලදී.

- සැලසුම් අංශය මගින් ඇල්ලේ වැව ව්‍යාපෘතියේ පිටවාන දියකඩනය නිර්මාණය කිරීම , පිටවාන හා සොරොව්ව අතර ඇති ආනත බෑවුම් සඳහා ආරක්ෂිත පැති බැම්ම නිර්මාණය කිරීම කොළඹ කලාපයේ අබලන්ව ඇති කහපිටිය, හේවාගම, මල්වාන සුළු ගංවතුර පාලන නිර්මිත නැවත නිර්මාණය කිරීම, ගාල්ල කලාපයේ නිල්වලා ව්‍යාපෘතියේ ගංවතුර පාලන බැම්ම සංරක්ෂණය හා අලුත්වැඩියාව සඳහා අවශ්‍ය නිර්මාණ කිරීම, අම්පාර කලාපයේ රදැල්ල අමුණ නිර්මාණය කිරීම හා ඉහත සඳහන් නිර්මාණ වලට අදාළ සැලසුම් පත් සකස් කිරීම සිදුකර ඇත. මීට අමතරව මඩකළපුව කලාපයේ යෝජිත ලවන්ආරු ජලාශය සඳහා පිටවානක් නිර්මාණය කිරීම සිදුකර ඇත.

- ව්‍යාපෘති සැලසුම් අංශය මගින් ගාල්ල කලාපයේ මාතර නිල්වලා යෝජනා ක්‍රමයේ ඇතිවන අධි ගංවතුර තත්වයන්හිදී නුපේ ඇල හරහා අතිරේක ජලය බැස්සවීමට ඇති හැකියාව සෙවීම සඳහා අධ්‍යනයන් සිදුකර ඇත. මීට අමතරව කොළඹ කලාපයේ යෝජිත රත්නපුර වේවැල්කඳුර ජලාශය සඳහා හා හම්බන්තොට කලාපයේ වීරකැටිය කොට්ඨාශයේ යෝජිත පුස්වැල්දොල ජලාශය සඳහා පූර්ව ශක්‍යතා අධ්‍යනයක් සිදුකෙරෙමින් පවතී.

- ජල ශක්ති අංශය මගින් ඇල්ලේ වැව ජලාශයේ පිටවාන් ආකෘතියෙහි වැඩිදියුණු කිරීම් හා අදාළ අධ්‍යනයන් සහ පහල මල්වතු ඔය ජලාශයෙහි පිටවාන් ආකෘති අධ්‍යනයන් සිදුකර අවසන් අධ්‍යන වාර්තාවන් ඉදිරිපත් කර ඇති අතර මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන යටතේ උතුරු මැද පළාත් ඇළට අදාළ කෝන්ගැටිය ජලාශයේ ආකෘතිය ඉදිකර අධ්‍යන කටයුතු සිදු කර ඇත.

- ලෝක බැංකු මූල්‍ය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන් ප්‍රවේශය (CResMPA) යටතේ ජලශක්ති පර්යේෂණාගාරයේ ප්‍රධාන ගොඩනැගිල්ල පිළිසකර කිරීම සිදුකෙරෙමින් පවතින අතර මෙම ව්‍යාපෘතිය යටතේ ජලශක්ති පර්යේෂණාගාරයේ ගෘහස්ත පර්යේෂණාගාරය, පරිගණක විද්‍යාගාරය, යාන්ත්‍රික වැඩපල සහ උපකරණ අංශය, විදුලි පද්ධතිය යන අංශ වැඩිදියුණු කිරීම සිදුවෙමින් පවතී.

- ජලශක්ති පර්යේෂණාගාරයේ උපකරණ අංශය මගින් 2024 වර්ෂය තුළ ත්‍රිකුණාමලය, මොණරාගල, හම්බන්තොට සහ බදුල්ල යන වාරි කළාප තුල මට්ටම් ගැනීමේ උපකරණ (Leveling Instruments) 113 ක් ඇතුළු දෙපාර්තමේන්තුවට අදාළ අනෙකුත් උපකරණ අළුත්වැඩියා කිරීම් සිදුකර ඇත.

- ඉංජිනේරුමය ද්‍රව්‍ය අංශය මගින් 2024 වර්ෂය තුල ක්ෂේත්‍ර හා රසායනාගාර පරීක්ෂණ 21,307 ක් පමණ සිදුකර ඇත.

- වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ඇති ඇල්ලේවැව, වීරවිල, තලපත්කුලම, අන්දරවැව, මාගල්ල වැව වැනි වැව් බැම්ම වල හා ලංකා විදුලිබල මණ්ඩලය යටතේ ඇති මාවුස්සාකැලේ සඳැලි බැම්මේ ජල කාන්දුවීම් හා වැව් බැම්මේ ඇති දෝශ හඳුනාගැනීමට භූගත විද්‍යුත් ප්‍රතිරෝධී පරීක්ෂණයන් (Ground Electrical Resistivity Survey) ඉංජිනේරු භූවිද්‍යා අංශය මගින් සිදුකරන ලදී. තවද, ඇල්ලෙවැව පිටවාන, තලපත්කුලම වැව ප්‍රතිසංස්කරණය, යාන් ඔය පිටවාන් ඇල හරහා පාලමක් ඉදිකිරීම හා යෝජිත වේවැල්කඳුර ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය භූ විද්‍යාත්මක සමීක්ෂණ කටයුතු ද ඇල්ලේවැව හා වීරවිල වැව් බැම්මි සවිගැන්වීම සඳහා මැටි-සිමෙන්ති පීඩනයක් සහිතව ඇතුල් කිරීමද සිදුකරන ලද අතර මෙම කටයුතු සඳහා ආරම්භයේදී භූගත විද්‍යුත් ප්‍රතිරෝධී පරීක්ෂණයන්වල සහය ලබා ගැනීම සිදුකරන ලදී.

- ඉඩම් පරිහරණ අංශය මඟින් කන්දෙකැටිය වාරියෝජනා ක්‍රමයේ බදුලුඔය සහ බත්මැඩිල්ල ප්‍රදේශ සඳහා ඉඩම් පරිහරණ අධ්‍යයනයක් සිදුකර ඒ මඟින් පාංශු සිතියම් සහ බෝග නිර්දේශ සිතියම් සකසන ලදි. ඊට අමතරව අනුරාධපුර සහ හම්බන්තොට දිස්ත්‍රික්ක වල පිහිටි ප්‍රධාන හා මධ්‍ය ප්‍රමාණ වැව් වල ජලයේ තත්ත්වය අධ්‍යයනය කරනු ලැබූ අතර කැලණි ගඟ, අත්තනගලු ඔය, ගිං ගඟ, නිල්වලා ගඟ, මල්වතු ඔය සහ මැණික් ගඟ ඇතුළු ගංගා කිහිපයක් සඳහාද ජලයේ තත්ත්වයේ අධ්‍යයන කිරීම සිදුකරන ලදි.

- ප්‍රධාන ගංගා ආශ්‍රිතව ජලගැලීම් අවස්ථා වැඩි සංඛ්‍යාවක් 2024 වසරේ වාර්ථා වූ අතර ඉන් නිල්වලා ගඟ, කළු ගඟ, අත්තනගලු ඔය, ගල්ඔය, මහවැලි ගඟ, ගිං ගඟ, කැලණි ගඟ, හැඩ ඔය, මුන්දෙනි ආරු, දැදුරු ඔය, මල්වතු ඔය සහ කලා ඔය ඇතුළු ජලමට්ටම් ලබාගන්නා ප්‍රධාන ගංගා ආශ්‍රිතව වාර්තා වූ ජලගැලීම් අවස්ථා 23 ක් සඳහා ආපදා කළමනාකරණ අංශ සහ ජනතාව

දැනුවත් කිරීම සඳහා ගංවතුර අවධානම් දැනුම් දීමේ නිවේදන 66 ක් නිකුත් කිරීම ජලවිද්‍යා හා ආපදා කළමනාකරණ අංශය මඟින් සිදු කර ඇත.

- පවතින ප්‍රතිපායන වක්‍ර (Rating Curves) සත්‍යාපනය කිරීම සහ නව ප්‍රතිපායන වක්‍ර නිර්මාණය කිරීම සඳහා අඩු, සාමන්‍ය සහ ගංවතුර අවස්ථාවන්හිදී බොහෝ මිනුම් ස්ථානවල මිනුම් ගැනීමේ කටයුතු (current metering) 82 ක් සිදු කර ඇත.

- ජල විද්‍යා හා ආපදා කළමනාකරණ අංශය මඟින් දිවයින පුරා එක්රැස් කරන ලද, ලේඛනගත කරන ලද හා සකස් කරන ලද ජල- කාලගුණික දත්ත වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ භාවිතය සඳහා පමණක් නොව රටේ ජලය ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වගකිව යුතු අනෙකුත් ආයතන මෙන්ම අධ්‍යයන හා පර්යේෂණ කටයුතු සඳහා විවිධ ආයතනයන්, ව්‍යක්තිකයන් සහ ශිෂ්‍යයන් විසින් ද භාවිතා කරනු ලැබේ. ඒ අනුව 2024 වර්ෂයේදී ජල විද්‍යා අංශය මඟින් එක් ගංගා ද්‍රෝණියක් සඳහා ලබා ගත හැකි සියලුම දත්ත පෞද්ගලික උපදේශකයින් 15 දෙනෙකුට සහ අධ්‍යයන පර්යේෂණ සඳහා සිසුන් 96 දෙනෙකුට නිකුත් කර ඇත.

- ලෝක බැංකු මූල්‍ය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන් ප්‍රවේශය (CResMPA) යටතේ ජල විද්‍යා හා ආපදා කළමනාකරණ අංශය මඟින් ජල මිනුම් ස්ථාන 14 ක ඉදිකිරීම් සහ වැඩිදියුණු කිරීම් අවසන් කර ඇති අතර, නව මිනුම් මධ්‍යස්ථාන 7 ක ඉදිකිරීම් සිදුවෙමින් පවතී.මීට අමතරව ගංවතුර ගැලීම් නිරීක්ෂණය හා සිතියම්කරණය සඳහා LiDAR ඩ්‍රෝන 3ක් මිලදීගෙන ඇත.

- තොරතුරු, සන්නිවේදන තාක්ෂණ හා භූගෝලීය තොරතුරු තාක්ෂණ අංශය මගින් සකස්කර ඇති භූ ගෝලීය තොරතුරු (GIS) දත්ත පද්ධතියට වගා බිම් ප්‍රමාණ, ඇළ පද්ධති, ජල පෝෂක ප්‍රදේශ, අමුණු දත්ත, සොරොව්, වාන්, වැව් බැම් වැනි ප්‍රධාන දත්ත ඇතුලත් කර ඇති අතර ජල විද්‍යාත්මක දත්ත සියල්ල ඒකාබද්ධ කිරීම තුලින් කාර්යක්ෂම ජල සම්පත් කළමනාකරණයක් සඳහා මග පාදනු ලැබේ. මෙම භූ ගෝලීය තොරතුරු දත්ත මගින් මුළු වගා කළ හැකි ප්‍රදේශ තක්සේරු කිරීමට සහ වාරි පද්ධති සැළසුම් වැඩි දියුණු කිරීමට උපකාරී වන අතර භූ ගෝලීය තොරතුරු දත්ත මගින් ඇළ මාර්ග පද්ධති නිරීක්ෂණය කිරීමට සහ ජල කළමනාකරණයට අවශ්‍ය දත්ත ලබාගැනීමට මග පාදයි. තවද ජල පෝෂක ප්‍රදේශ වලින් ලබා ගන්නා වර්ශාපතන හා ගංගා ජල මට්ටම් පිළිබඳ දත්ත ගංවතුර පාලනය සඳහා වැදගත් වේ.

- ජල සම්පත් සැලසුම් අංශය මගින් නිල්වලා ගංගා ද්‍රෝණියේ පමණක් ජලය මුරුතවෙල හා චන්ද්‍රිකා වැව වෙත හරවා යැවීම එම ජලාශ වල අනාගත ජල අවශ්‍යතාවයට ප්‍රමාණවත් ද යන්න පරීක්ෂා කිරීමට ජල විද්‍යාත්මක අධ්‍යයනය, උමා ඔය ජල හැරවුම මඟින් ලැබන ජලයෙන් කිරිඳි ඔය ද්‍රෝණියේ අලිකොට ආර, හඳපානාගල හා කුඩා ඔය යටතේ වගා කළ හැකි වගා වපසරිය හඳුනා ගැනීමේ අධ්‍යයනය, බදුලු ඔයෙහි පිහිටි බදුලු ඔය අමුණේ, උස වැඩි කිරීමේ යෝජනාව සඳහා අවශ්‍ය ජල විද්‍යාත්මක අධ්‍යයනය, වලවේ ගඟෙහි අත්තක් වන කටුප ඔය හරහා යෝජිත වේවැල් කඳුර කුඩා ජලාශය පිළිබඳ ජල විද්‍යාත්මක අධ්‍යයනය හා හම්බන්තොට ඉදිකිරීමට යෝජිත තෙල් පිරිපහදු මධ්‍යස්ථානයට ජලය සපයා දීම පිළිබඳ මූලික ජල විද්‍යාත්මක අධ්‍යයනය ආදී අධ්‍යනයන් කිහිපයක් සිදු කර ඇත.

2.1.2 ක්‍රම කළමනාකරණ අංශය

- 2023/24 මහ කන්නය ආරම්භයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ජලාශවල ජල ධාරිතාවය 28% ක් විය. 2023/24 මහ කන්නය සඳහා වගා කිරීම ආරම්භ කළ අතර මුළු බිම් ප්‍රමාණයෙන් 92% ක් සාර්ථකව වගා කරන ලදී. 2024 යල කන්නය ආරම්භයේදී ජලාශවල ධාරිතාවය 87% ක් වූ අතර නිසි කළමනාකරණය හේතුවෙන් 84% ක භූමි ප්‍රමාණයක් සාර්ථකව වගා කිරීමට හැකි විය.

- 2024 යල කන්නයේ වගාවෙන් පසු ජලාශ වල ඉතිරිව තිබූ ජලය භාවිතා කරමින් 3 වන කන්නය සඳහා අතිරේක හෝග හෙක්ටයාර 25,964ක් වගා කිරීමට හැකි විය. 2023/24 වසර සඳහා වගා තීව්‍රතාවය අදාල ව්‍යාපාර තුල 184 % ක් ලෙස වැඩි කිරීමට හැකි විය.

- වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් පානීය ජල අවශ්‍යතාවයන් ඇතුළු අනෙකුත් අවශ්‍යතා සඳහා ප්‍රධාන ජලාශ වලින් වසරකට ජලය ඝන මීටර් මිලියන 250 හා මධ්‍යම පරිමාණ ජලාශ වලින් වසරකට ඝන මීටර් මිලියන 120 ලබා ගැනීම සඳහා අනුමැතිය ලබාදී ඇති අතර ගංගා හෝ අතු ගංගා මගින් ජලය ඝන මීටර් මිලියන 780 ප්‍රමාණයක් වසරකදී ලබා ගැනීමට අනුමැතිය ලබා දී ඇත.

- වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන සේනානායක සමුද්‍රයෙන් සහ දැදුරු ඔය ජලාශයෙන් පමණක් ජල විදුලිය සඳහා ජලය මුදාහරින අතර පිළිවෙලින් ජලය ඝන මීටර් මිලියන 803 සහ 116ක ප්‍රමාණයක් එම ජලාශ වලින් ජල විදුලි උත්පාදනය සඳහා 2024 වසර තුල යොදාගෙන ඇත.

- පර්යේෂණ සහාය සහ ක්‍රමවේද ප්‍රවර්ධන අංශය මඟින් රජයේ ඉඩම් හා වාරිමාර්ග රක්ෂිත ආරක්ෂාකර ගැනීමත් එම භූමිය ඵලදායි කටයුතු සඳහා යොදා ගැනීමටත් ගොවි ජනතාව අතර පලතුරු වගාව ප්‍රචලිත කිරීමත් ඔවුන්ගේ දැනුවත් භාවය වැඩිදියුණු කිරීමත් අරමුණු කරගෙන වීරකැටිය ප්‍රාදේශීය වාරිමාර්ග කොට්ඨාසයේ මුරුතවෙල ව්‍යාපාරයට අයත් තෙලඹුයාය ඒකක කාර්යාල භූමිය තුළ විසිරි ජල සම්පාදනය යටතේ ආදර්ශ පලතුරු වගා ආදර්ශන වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලද අතර ඒ යටතේ අක්කර ¾ භූමි ප්‍රමාණයක TJC අඹ, පේර සහ දෙළුම් පැළ වගා කරන ලදී.

- ප්‍රධාන ඇල මාර්ග කි.මී. 3577 ක්, අතු ඇල මාර්ග කි.මී. 913 ක්, වැව් බැම් කි.මී. 994 ක්, කෙත් ඇල මාර්ග කි.මී. 1791 ක් හා අපවහන ඇල මාර්ග කි.මී. 3166 ක් අතරින් තෝරාගත් ස්ථානවල මෙහෙයුම් හා නඩත්තු කටයුතු යටතේ 2024 වර්ෂයේදී වෙන් කර ඇති ප්‍රතිපාදන රු. මී. 2050 න් 98% ක මූල්‍ය ප්‍රගතියක් සහිතව අත්‍යාවශ්‍ය නඩත්තු කටයුතු සිදු කර ඇත.

- භෞතික සම්පත් කළමනාකරණ අංශය මඟින් ක්‍රියාත්මක කරන ලද පොළොන්නරු දිස්ත්‍රික් වාරි සංවර්ධන ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කටයුතු සඳහා ප්‍රතිපාදන, තෝරාගත් මහා වාරිමාර්ග ව්‍යාපෘති වල අත්‍යාවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු (ERIMIS) වැය විෂය මගින් සපයා ගැනීමෙන් සිදු කර ඇත.

- වාරි ඵලදායිතා ප්‍රවර්ධනය අරමුණු කරගෙන සේවාලාභීන් වන ගොවි ප්‍රජාව වෙත වඩාත් කාර්යක්ෂම සේවාවන් සැපයීම උදෙසා ලංකාව පුරා විහිදී ක්‍රියාත්මක කරනු ලබන ඒකක කාර්යාල 224 මගින් අදාළ ව්‍යාපාර කළමනාකරණ කටයුතු සිදුකරනු ලබන අතර, එයින් 2024 වර්ෂයේදී ඒකක කාර්යාල 45 ක් වැඩිදියුණු කිරීම සිදුකරන ලදී. එමෙන්ම ගොවීන් හා ව්‍යාපාර කළමනාකරුවන්ගේ දැනුම කුසලතා සහ ආකල්ප වැඩිදියුණු කිරීමේ අරමුණින් පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් 08ක් දිවයින පුරා ක්‍රියාත්මක කරන ලදී.

- දෙපාර්තමේන්තුවේ නිළධාරීන් සඳහා ජල සම්පත් කළමනාකරණය ඇතුළු වාරිමාර්ග ක්ෂේත්‍රයේ පුහුණු කිරීම් සඳහා පිහිටුවා ඇති ගල්ගමුව වාරිමාර්ග අභ්‍යාස ආයතනය මගින් වාරිමාර්ග ඉංජිනේරුවරුන්,ඉංජිනේරු සහකාරවරුන්, සැළසුම් ශිල්පීන් හා ගබඩා භාරකරුවන් සඳහා සේවස්ථ පුහුණු වැඩමුළු 08 ක් පැවැත්වූ අතර ඉංජිනේරු සහකරුවන්, සැළසුම් ශිල්පීන් හා තාක්ෂණික සහයකවරුන් සඳහා තාක්ෂණික පරීක්ෂණ හා කාර්යක්ෂමතා කඩයිම් විභාග 08 ක් පවත්වා ඇත.මීට අමතරව බාහිර ආයතන සඳහා පුහුණු වැඩමුළු 10 ක් පවත්වා ඇත.

- ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වන ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියෙහි (IWWRMP) පළමු අදියර යටතේ ප්‍රධාන පැකේජ 10 ක් ක්‍රියාත්මක වූ අතර ඉන් 07 ක් පමණ සාර්ථකව සම්පූර්ණ කර ඇත. එහි දෙවන අදියර යටතේ වැඩ විෂයන් 15 ක් සිදු කිරීමට නියමිත වන අතර 2024 වර්ෂය අවසාන වන විට ඇස්තමේන්තු සකස්කර ඇත. ඒ අතරින් දැනට ලංකාවෙහි විශාලම ජලාශය වන සේනානායක සමුද්‍රයෙහි රළපනාව පුනරුත්ථාපනය මගින් එහි වේල්ල ශක්තිමත් කිරීම ඇතුළුව ප්‍රධාන වේලි 5ක් ශක්තිමත් කිරීම හා වාරිමාර්ග යෝජනා ක්‍රම වල ප්‍රධාන පද්ධති 05 ක් ප්‍රතිසංස්කරණය කිරීම සිදුකර ඇත.එසේම මෙම ව්‍යාපෘතිය යටතෙහිම වාරිමාර්ග උප පද්ධතියේ අත්‍යාවශ්‍ය හා හදිසි පුනරුත්ථාපන කටයුතු 387 ක් සාර්ථකව නිම කරන ලද අතර භෞතික ප්‍රගතිය 100%ක් වේ.

2.1.3 ගංගාධාර කළමනාකරණ අංශය

- ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව වාරිමාර්ග විෂයපථයට අදාලව මුළු රටම ආවරණය වන පරිදි ජල සම්පත් සැලසුම් කිරීමේ කටයුතු වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් සිදුකළ අතර පළාත් සභා පිහිටුවීමෙන් පසු අන්තර් පළාත් ගංගා ද්‍රෝණි කළමනාකරණ කටයුතු දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබයි. ඒ හා සම්බන්ධ විශේෂඥ දැනුම හිමි ආයතනයන් ලෙස ප්‍රධාන ගංගා ද්‍රෝණි 103 ට අදාලව අවශ්‍ය අවස්ථා වල මැදිහත් වීම සහ උපදෙස් ලබා දීම සම්බන්ධයෙන් කටයුතු කිරීම 2018 වර්ෂයේ පිහිටුවන ලද ගංගාධාර කළමනාකරණ අංශය මගින් සිදුකරනු ලබයි. දැනට අන්තර් පළාත් ගංගාවන්හි භෞතිකමය වෙනස්වීම්, ගංඟා ඉවුරු ආරක්ෂණය, ගංඟාවන්හි පිරිසිදුකම හා ආරක්ෂාව සඳහා ප්‍රජාව දැනුවත් කිරීම, පවතින ප්‍රතිපාදන සීමාවන් තුල එම අංශය මඟින් ඉටුකරනු ලබයි.

- ගංඟාධාර කළමනාකරන අංශය මගින් ප්‍රතිපාදන ලබාදීමෙන් කන්තලේ කොට්ඨාසයේ ජනරංජන ව්‍යාපාරයේ අක්කර 400 පමණ කුඹුරු ප්‍රමාණයකට මහවැලි ගඟෙහි ගංවතුරින් සිදුවන හානි වැළැක්වීමට මීටර් 375 ක පමණ ගංවතුර ආරක්ෂණ වැටි වැඩිදියුණු කිරීමටත් කන්තලේ වැවෙහි පිටවානෙන් ජලය ගලාබස්නා මාර්ගයේ තිබූ බාධක ඉවත්කර කුඹුරු අක්කර 300 ක් පමණ ආරක්ෂා කිරීමටත් දැදුරු ඔයේ හලාවත ප්‍රධාන පාලම හා අනෙකුත් පාලම් ආශ්‍රිතව සහ විවිධ ස්ථානවල වැලි තැන්පත් වීම නිසා ජලය බැස යාමට ගැටලුවක්ව පැවතින බැවින් තැන්පත් වී තිබූ වැලි ඉවුරු වලට ඉවත් කර ජල මාර්ගයේ පිරිසිදු කිරීමෙන් බිංගිරිය ආශ්‍රිත දැදුරු ඔය ඉහළ ධාරා ප්‍රදේශයේ ජලය ගැලීම් අවම කිරීම ඇතුළු වැඩ යෝජනා 130 ක පමණ කටයුතු කර ඇත.

- ජල අපවහන හා ගංවතුර පද්ධති අංශය මගින් ගිං ගඟ, නිල්වලා ගඟ ආශ්‍රිත ජලාපවහන ව්‍යාපෘති තුල අපවහන ජල මාර්ග පිරිසිදු කිරීම සහ ප්‍රධාන වශයෙන් නිල්වලා ගංවතුර පාලන ව්‍යාපෘතිය යටතේ පවතින පොම්පාගාරවල පොම්ප 24 න් 04 ක් පූර්ණ වශයෙන් අලුත්වැඩියා කොට වසර අවසන් වන විට සියළු පොම්ප ක්‍රියාකාරීත්වයට පත්කර ඇත. ඊට අමතරව පොම්පාගාරවල ගුරුත්ව ගේට්ටු අළුත්වැඩියාව, විදුලි පද්ධති අලුත්වැඩියාවන් සිදු කල අතර ගිං ගඟ ජල පාලන ව්‍යාපෘතියේ වේලි වැඩිදියුණු කිරීම් සිදු කරන ලදී.

- අත්තනගලු ඔය, බෙන්තර ගඟ සහ කළු ගඟ ද්‍රෝණි වලට අයත් ජලාපවහන ඇළ මාර්ග පිරිසිදු කිරීමේ කටයුතු සිදු කරන ලද අතර, ගංවතුර පාලන ව්‍යාපෘතිවල වාර්ෂිකව සිදුකරන ගංවතුර වේලි සහ නිර්මිත නඩත්තු කිරීම සහ ක්‍රියාත්මක කිරීම සිදු කරන ලදී.

- කැළණි ගඟ ගංවතුර ආරක්ෂණ ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලද අකරවිට කලුඅග්ගල මාර්ගයේ කැළණි ගං ඉවුරු සංරක්ෂණය හා කොහිලවත්ත සුසාන භූමිය ආසන්නයේ බාදනයට ලක්ව පැවති ඉවුරු සංරක්ෂණය කර යථා තත්වයට පත් කිරීම ඉතා කඩිනමින් 2024 වසර තුලදී සිදු කරනු ලැබූ අතර ජා ඇලෙහි ගංවතුර ආරක්ෂණ බැම්මක් ඉදි කර එහි අවශ්‍ය පරිදි ඉවුරු සංරක්ෂණය ද සිදු කරන ලදී.

- මා ඔය, අත්තනගලු ඔය හා බෙන්තර ගඟ ගංවතුර ආරක්ෂණ පද්ධති වැඩි දියුණු කිරීම සහ කැළණි, කළු ගඟ, නිල්වලා හා ගිං ගඟ ද්‍රෝණි වල ගංවතුර වැලැක්වීමේ ව්‍යාපෘති වල ඉතිරි වැඩ අවසන් කිරීම සඳහා 2024 වසර තුළදි තෝරාගත් මහා වාරිමාර්ග ව්‍යාපෘති වල අත්‍යාවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු (ERIMIS) වැය විෂය මගින් ප්‍රතිපාදන සපයා ගැනීමෙන් පසු ඉටුකර ඇත.

2.1.4 ඉදිකිරීම් සහ සංවර්ධන අංශය

- වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත ඒරුවැව සිට මහකනදරාව දක්වා පෝෂිත ඇළ ඉදිකිරීමේ ව්‍යාපෘතිය සහ මහකිතුල පිවිසුම් උමං මාර්ගය හා ඇළ ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා 2024 වසරට ප්‍රතිපාදන ලබා දී ඇත.ඉන් මහකිතුල පිවිසුම් උමං මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය මෙම අවස්ථාවේදී ඵලදායී නොවන නිසා සිදු නොකරන ලද අතර එරු වැව සිට මහකනදරාව පෝෂිත ඇළ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.එමෙන්ම මහගල්ගමුව පෝෂිත ඇල ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා 2024 වර්ෂයේදී ප්‍රතිපාදන ලබා දී නොමැත.

- ඉදිකිරීම් හා සංවර්ධන අංශය මගින් සිදුකරනු ලබන ඉදිකිරීම් කටයුතු වල ප්‍රගතිය ‘‘මහා පරිමාණ සහ මධ්‍යම පරිමාණ වාරි ව්‍යාපෘති’’ යටතේ දක්වා ඇත.

2.1.5 යන්ත්‍ර සහ යාන්ත්‍රික වැඩපල අංශය

- යන්ත්‍ර හා යාන්ත්‍රික අංශය මගින් දෙපාර්තමේන්තුව සතු පරිහරණය කරන සියළුම වාහන සඳහා 2024 වර්ෂය තුල පූර්ණ රථවාහන රක්ෂණාවරණය සිදුකිරීමට කටයුතු කර ඇති අතර යාන්ත්‍රික වැඩපල මගින් වාහන හා යන්ත්‍ර, ගේට්ටු අළුත්වැඩියාවන් ඇතුළුව වැඩ 2976 ක ප්‍රමාණයක් නිම කර ඇත. එමෙන්ම නව කුඩා ඩ්‍රෙජර් යන්ත්‍ර 06 ක් මිලට ගෙන ක්ෂේත්‍ර සේවය සඳහා යොදවා ඇත.තවද 2024 වර්ෂය ආරම්භයේ පැවති වාහන අනතුරු 54 න් 25 ක් සම්බන්ධ මු.රේ. 109 අනුව කටයුතු කර කපා හැර ඇත.

මහා පරිමාණ වැව් හා ජලාශයන්හි පැවති ධාරිතාවය, වගා තිව්‍රතාවය, වගා කරන ලද භූමි ප්‍රමාණය පිලිබඳ තොරතුරු

අනු අංකය	කලාපය	ජලාශය (මහා පරිමාණ)	වගා භූමි ප්‍රමාණය (අක්කර)	ධාරිතාවය (MCM)	වගා තිව්‍රතාවය			සම්පූර්ණ වගා තිව්‍රතාවය	31/12/2024 දිනට ජලාශ ධාරිතාවය (MCM)	පානීය ජලය ලබා ගැනීම සඳහා අවසර ලබා දීම (MCM/year)
					2023-2024 මහ කන්නය	2024 යල කන්නය	2024 අතරමැදි කන්නය			
1	අම්පාර	අම්බලන් ඔය	5,251	44.30	1.00	1.00	0.07	2.07	41.53	-
2		එක්ගල් ඔය	2,501	29.00	1.00	1.00	0.03	2.03	24.67	-
3		නාමල් ඔය	3,699	52.70	1.00	1.00	0.03	2.03	51.00	-
4		පල්ලන් ඔය	3,499	115.60	1.00	1.00	0.10	2.10	61.80	0.37
5		පන්නල්ගම	4,601	34.00	1.00	1.00	0.01	2.01	33.49	-
6		රඹකැන් ඔය	2,246	56.10	1.00	1.00	0.22	2.22	38.02	8.21
7		රොට්ටිකුලම	1,428	6.30	1.00	1.00	0.01	2.01	3.90	-
8		සේනානායක සමුද්‍රය	120,204	949.80	0.95	0.97	0.10	2.03	712.95	8.76
9		කළුගල් ඔය	1,124	10.10	0.81	0.81	0.67	2.29	9.52	-
10	අනුරාධපුර	හුරුළු වැව	10,400	67.80	1.00	1.00	0.00	2.00	47.67	-
11		මහකනදරාව	6,101	44.70	1.00	1.00	0.03	2.03	46.55	2.45
12		මහවිලච්චිය	2,664	40.10	1.00	1.00	0.15	2.15	40.33	-
13		මානන්කට්ටිය	1,050	6.00	1.00	1.00	0.01	2.01	6.02	-
14		නාච්චාදුව	7,000	55.70	1.00	1.00	0.07	2.07	55.26	0.01
15		නුවර වැව	2,599	44.50	1.00	1.00	0.58	2.58	44.36	4.02
16		පදවිය	8,700	104.80	1.00	1.00	0.26	2.26	103.00	-
17		රාජාංගන	16,000	100.70	1.00	1.00	0.39	2.39	99.69	-
18		වාහල්කඩ	1,999	53.00	1.05	1.05	0.20	2.30	52.01	3.29
19		යාන් ඔය	14,922	169.00	0.68	0.68	0.00	1.37	139.59	-
20	බදුල්ල	අඹේවෙල	1,006	2.40	1.00	1.00	0.00	2.00	2.51	10.38
21		දඹරාව	1,500	15.90	1.00	1.00	0.00	2.00	15.05	-
22		කන්දෙ ඇළ	2,301	2.20	1.00	1.00	0.00	2.00	2.16	0.67
23		මාපාකඩ	1,500	9.50	1.00	1.00	0.00	2.00	4.75	-
24		නාගදීප	4,201	29.40	1.00	1.00	0.00	2.00	12.58	-
25		සොරබොර	2,002	20.70	1.00	1.00	0.00	2.00	15.85	-
26		මොරාණ	1,302	16.59	0.46	0.46	0.00	0.92	13.79	-
27	මඩකළපුව	නවකිරි	18,399	65.40	1.01	0.87	0.00	1.88	46.95	-
28		රූගම්	9,753	22.90	1.17	1.02	0.04	2.23	11.65	12.78
29		උන්නිච්චි	15,389	67.90	1.06	0.80	0.00	1.86	42.88	0.09
30		වාහනේරි	9,842	16.70	1.11	1.03	0.00	2.13	10.40	0.27
31	හම්බන්තොට	බදගිරිය	1,749	11.20	1.00	1.00	0.94	2.94	10.58	-
32		කැකිරිඕබඩ		2.69	-	-	-	-	2.66	-
33		ලුණුගම්වෙහෙර	13,499	226.70	1.00	1.00	1.00	3.00	208.11	19.71
34		මව්ආර	3,800	41.00	1.00	1.00	0.13	2.13	32.92	-
35		මුරුතවෙල	4,426	48.00	0.95	0.95	0.00	1.91	45.92	2.01
36		රිදියගම	8,498	32.10	1.00	1.00	0.12	2.12	30.91	12.78
37		තිස්සවැව	2,750	4.30	1.00	1.00	0.00	2.00	4.43	-
38		වෙහෙරගල		75.24	-	-	-	-	68.70	3.65
39		විරවිල	2,599	14.40	0.89	0.89	0.89	2.67	13.38	-
40		යෝධ වැව	3,499	10.30	0.92	0.92	0.00	1.83	8.08	-

අනු අංකය	කලාපය	ජලාශය (මහා පරිමාණ)	වගා භූමි ප්‍රමාණය (අක්කර)	ධාරිතාවය (MCM)	වගා නිවුතාවය			සම්පූර්ණ වගා නිවුතාවය	31/12/2024 දිනට ජලාශ ධාරිතාවය (MCM)	පානීය ජලය ලබා ගැනීම සඳහා අවසර ලබා දීම (MCM/year)
					2023-2024 මහ කන්නය	2024 යල කන්නය	2024 අතරමැදි කන්නය			
41	ගාල්ල	ඇල්ලෙවෙල	1,305	1.00	0.97	0.97	0.00	1.94	1.06	-
42		කැකණදුර	1,100	2.80	0.55	0.36	0.00	0.91	2.81	0.91
43	මහනුවර	දේවහුව	3,000	13.60	1.00	1.00	0.17	2.17	13.57	-
44		නාලන්ද		15.86	-	-	-	-	15.48	1.10
45		වෑමැඩිල්ල	1,999	5.67	1.00	1.00	0.05	2.05	5.78	-
46	කුරුණෑගල	අඹකොළ වැව	840	8.26	1.00	0.48	0.00	1.48	7.36	-
47		අත්තරගල්ල	1,035	4.50	1.00	0.48	0.00	1.48	4.53	-
48		බතලගොඩ	7,635	5.97	1.00	0.94	0.00	1.94	5.26	-
49		දැදුරු ඔය	6,499	75.20	1.00	0.85	0.00	1.85	67.55	12.96
50		හක්වටුනා වැව	6,373	24.30	1.00	0.42	0.00	1.42	23.71	-
51		කිඹුල්වාන ඔය	2,451	8.50	1.00	1.00	0.00	2.00	8.44	-
52		මැඩියාව	1,441	3.20	1.00	0.49	0.00	1.49	3.33	-
53		මාගල්ල	7,000	9.20	0.96	0.96	0.14	2.06	8.25	3.01
54		ජයවැව	2,399	9.50	1.00	0.44	0.00	1.44	9.03	-
55		උස්ගල සියඹලන්ගමුව	2,100	26.70	1.00	1.00	0.24	2.24	26.72	2.19
56	මොණරාගල	ඇතිමලේ	1,003	6.80	1.00	1.00	0.00	2.00	6.80	-
57		හඳපානාගල	1,700	18.25	0.86	1.00	1.00	2.86	10.27	-
58		මුතුකණ්ඩිය	1,999	30.30	1.00	1.00	0.00	2.00	30.35	1.10
59	පොලොන්නරුව	ගිරිතලේ	7,601	27.00	1.00	1.00	0.00	2.00	25.69	-
60		කවුඩුල්ල	18,616	128.30	1.14	1.30	0.00	2.44	113.48	5.45
61		මින්නේරිය	22,476	135.70	1.00	1.00	0.00	2.00	126.74	5.42
62		පරාක්‍රම සමුද්‍රය	25,187	143.20	1.00	1.00	0.00	2.00	120.88	2.61
63	පුත්තලම	ඉහිනිමිටිය	6,005	72.60	0.87	0.00	0.00	0.87	68.61	4.56
64		තබ්බෝව	2,093	19.00	1.07	1.07	0.29	2.43	17.59	-
65	ත්‍රිකුණාමලය	කන්තලේ	18,560	140.60	1.00	1.00	0.27	2.27	110.11	8.21
66		මහදිවුල් වැව	2,100	24.60	1.00	1.00	0.00	2.00	23.83	0.69
67		මොරවැව	4,801	42.90	1.00	1.00	0.00	2.00	34.56	-
68		වෙන්ඩ්‍රාසන්	1,749	25.00	1.00	1.00	0.00	2.00	17.32	-
69		වාන් ඇළ	1,621	2.90	1.00	1.00	0.00	2.00	2.70	-
70	මන්නාරම	පාවට්කුලම	4,134	33.30	1.00	0.46	0.12	1.58	21.59	-
71		අකතිමුරුප්පු	6,350	9.40	1.00	0.05	0.00	1.05	7.21	-
72		යෝධ වැව	31,340	38.20	1.00	0.25	0.00	1.25	37.85	-
73		වියාදිකුලම්	1,552	2.20	1.00	1.00	0.00	2.00	1.18	-

ඉහත සඳහන් මහා පරිමාණ ජලාශ වලට අමතරව මධ්‍ය පරිමාණ ජලාශ 161ක මුළු ධාරිතාවය 267MCM වන අතර මුළු වගා භූමි ප්‍රමාණය අක්කර 56,630ක් වේ. ඉන් 2023/24 මහ කන්නයේ අක්කර 55,313ක්ද, 2024 යල කන්නයේ අක්කර 43,464ක්ද වගා කරන ලදී.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වූ ප්‍රධාන ව්‍යාපෘතීන්හි ප්‍රගතිය පහත පරිදි සාරාංශගත කොට දැක්විය හැකිවේ.

මහා පරිමාණ සහ මධ්‍යම පරිමාණ වාරි ව්‍යාපෘති

		පිටු අංකය
1.	යාන් ඔය ව්‍යාපෘතිය	23
2.	මොරාණ ජලාශය	25
3.	ඇල්ල වැව ජලාශය	26
4.	මුන්දෙනිආරු ගංගා ද්‍රෝණි සංවර්ධන ව්‍යාපෘතිය (රූගම් කිතුල් ජලාශය)	27
5.	කැළණි ගඟ ආරක්ෂණ බැම්ම ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය	28
6.	ගොඩිගමුව ව්‍යාපෘතිය සංවර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම.	29
7.	උමා ඔය පහළ සංවර්ධන ව්‍යාපෘතිය	30
8.	හිඹිලියාකඩ වත්තේගෙදර වාරිමාර්ග යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.	32
9.	පහළ මල්වතු ඔය බහු කාර්යය සංවර්ධන ව්‍යාපෘතිය	33
10.	තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය	35
11.	බැරැක් ප්ලේන් සංවර්ධන ව්‍යාපෘතිය	36
12.	ඒරු වැව - මහකනදරාව පෝෂිත ඇල ව්‍යාපෘතිය	37
13.	තෝරාගත් මහා වාරිමාර්ග ව්‍යාපෘති වල අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු (ERIMIS)	39
14.	පොළොන්නරු දිස්ත්‍රික් වාරි සංවර්ධන ව්‍යාපෘතිය	40

වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වෙන වෙනත් ව්‍යාපෘති

1.	බස්නාගොඩ ජලාශ ව්‍යාපෘතිය	41
2.	ඒකාබද්ධ ජලධාර හා සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP)	42
3.	දේශගුණික අවබලපෑම් - බහු පියවර වැඩසටහන් ක්‍රියාමාර්ග ප්‍රවේශය (CResMPA)	43

1. යාන් ඔය ජලාශ ව්‍යාපෘතිය

ඇස්තමේන්තු ගත මුදල	රු.මි. 48,355.3	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	අනුරාධපුර සහ ත්‍රිකුණාමලය
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව / වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 169 නව කුඹුරු ඉඩම් හෙක්ටයාර 1515 ඇතුළුව හෙක්ටයාර 8,700
ව්‍යාපෘති කාලය	2012-2024	**ප්‍රතිලාභීන්**	පවුල් 9,000
කල් දිගු ලබාදීම්	2020 - 2024	**කල් දිගු ලබා දීමට හේතු**	නියමිත පරිදි ව්‍යාපෘතිය අවසන් වී නොතිබීම
ප්‍රතිපාදන 2024	රු.මි. 6,000	**2025 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 2,350
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 41,956.83	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	95.52
2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 2,573.03		
2024 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන /දරන ලද වියදම	• ඉස්සන්වැව නව වාරි ඉඩම් සංවර්ධනය කිරීම. • ජයන්තිවැව පහළ නිම්න සංවර්ධනය කිරීම. • දකුණු ඉවුර ඇළ යටතේ ජලය සපයනු ලබන ඇළ පද්ධතිය වැඩි දියුණු කිරීම. • පුල්මොඩේ අමුණ සහ ඒ යටතේ ජලය සපයන ඇළ පද්ධතිය වැඩිදියුණු කිරීම. • ජලාශය සහ වම් ඉවුරු ප්‍රධාන ඇල ඉදිකිරීම සඳහා අත්පත් කර ගත් ඉඩම් සඳහා වන්දි ගෙවීම්. • විකල්ප කුඹුරු ඉඩම් සඳහා වන්දි ලබා දීම. • වාහල්කඩ කපුගොල්ලැව මාර්ගය ඉදි කිරීම. • වම් ඉවුරු ප්‍රධාන ඇල ඉදිකිරීම • යටිතල පහසුකම් සහ නැවත පදිංචි කිරීම • වැට් සහ අනෙකුත් බදු • අනෙකුත් වියදම	රු.මි. 414.42 රු.මි. 322.83 රු.මි. 242.06 රු.මි. 138.40 රු.මි. 236.11 රු.මි. 788.4 රු.මි. 296.53 රු.මි. 63.34 රු.මි. 2.39 රු.මි. 6.65 රු.මි. 61.91	
2025 වසර සඳහා යෝජිත වැඩසටහන	• ඉස්සන්වැව නව වාරි ඉඩම් සංවර්ධනය අවසන් කිරීම . • ජයන්තිවැව පහළ නිම්න සංවර්ධනය, දකුණු ඉවුර ඇළ යටතේ ජලය සපයනු ලබන ඇළ පද්ධතිය සංවර්ධනය, පුල්මොඩේ අමුණ සහ ඒ යටතේ ජලය සපයන ඇළ පද්ධතිය වැඩිදියුණු කිරීම අවසන් කිරීම. • ජලාශය සහ වම් ඉවුරු ප්‍රධාන ඇල ඉදිකිරීම සඳහා අත්පත් කර ගත් ඉඩම් සඳහා වන්දි ගෙවීම්. • විකල්ප කුඹුරු ඉඩම් ලබා දීම අවසන් කිරීම. • වාහල්කඩ කපුගොල්ලැව මාර්ගය ඉදි කිරීම අවසන් කිරීම • යාන් ඔය වාන් ඇළ හරහා ඉදි කිරීමට නියමිත පාලම නිම කිරීම. • ඉදුල්හිටියාව නව වාරි ඉඩම් සංවර්ධනය අවසන් කිරීම . • විදුලි වැටවල් ඉදිකිරීම අවසන් කිරීම.		

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• නව වගා බිම් හෙක්ටයාර 1,515ක් ඇතුළුව සම්පූර්ණ හෙක්ටයාර 8,700ක් සඳහා වාරි පහසුකම් සැපයීම • අනුරාධපුර සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්ක දෙකෙහිම ජනතාව සඳහා පානීය ජලය සැපයීම. • මාර්ග සංවර්ධනය: කිලෝමීටර් 8ක කාපට් මාර්ග, කිලෝමීටර 40ක බොරළු මාර්ග • ජලය, විදුලිය, පාසල්, පොදු ගොඩනැගිලි ආදිය සැපයීම ඇතුළුව මල්පෝරුව, කජුවත්ත, උරැව ඕමාරකඩ සහ D6 වාහල්කඩ නැවත පදිංචි කිරීමේ ගම්මාන සංවර්ධනය කිරීම. • කිලෝමීටර් 16ක් දිගින් යුත් අලි වැටවල් ඉදි කිරීම. • ගෝමරන්කඩවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පදවිය මහා වාරි යෝජනා ක්‍රමය, යාන්ඔය අමුණ යෝජනා ක්‍රමය සහ කුඩා/මධ්‍යම පරිමාණ වැව්වල ජල භිඟය විසඳීම. • මිරිදිය ධීවර හා පශු සම්පත් කර්මාන්තය සඳහා පහසුකම් සැලසීම. • වාහල්කඩ සහ ත්‍රිකුණාමලය අතර ප්‍රවාහන දුර කිලෝමීටර 60කින් පමණ අවම කිරීම.
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	• නව වගා බිම් හෙක්ටයාර 354 ක් ඇතුළුව සම්පූර්ණ හෙක්ටයාර 9,503ක් සඳහා වාරි පහසුකම් සැපයීම • මාර්ග සංවර්ධනය : කි.මී 8 කාපට් මාර්ගය සහ කිලෝමීටර 40 බොරළු මාර්ග • ජලය, විදුලිය, පාසල්, පොදු ගොඩනැගිලි ආදිය සැපයීම ඇතුළුව මල්පෝරුව, කජුවත්ත, උරැව ඕමාරකඩ සහ D6 වාහල්කඩ නැවත පදිංචි කිරීමේ ගම්මාන සංවර්ධනය කිරීම. • වාහල්කඩ සහ ත්‍රිකුණාමලය අතර ප්‍රවාහන දුර අවම කිරීම. • මිරිදිය ධීවර කර්මාන්තය සඳහා පහසුකම් සැලසීම
අපේක්ෂිත පරිදී නිම කිරීමට නොහැකි වීමට හේතු	• ඉඩම් අත්පත් කර ගැනීමේ ප්‍රමාදය • 2021 දී කොවිඩ් වසංගතය, 2022 දී ආර්ථික අර්බුදය හේතුවෙන් ඉන්ධන සහ ඉදිකිරීම් ද්‍රව්‍යවල සැපයුම සීමා වීම සහ ඉදිකිරීම් ද්‍රව්‍යවල මිල අනපේක්ෂිත ලෙස ඉහළ යාම. • RAMP කමිටු තීරණය හේතුවෙන් ඉදිකිරීම් සිමා කිරීම. • තක්සේරු කිරීම ප්‍රමාද වීම හේතුවෙන් වන්දි ගෙවීම ප්‍රමාද විය. • සංවර්ධනය සඳහා ඉඩම් නිදහස් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් වාරිමාර්ග ඉඩම් සංවර්ධන කටයුතු ප්‍රමාද විය.
අභියෝග	• සැලසුම් කළ පරිදි අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ නැවත පදිංචි කිරීමේ කටයුතු සිදු කිරීමට ප්‍රමාණවත් ඉඩම් නොමැති වීම. • ඉඩම් අත්පත් කිරීමේ සහ විකල්ප ඉඩම් ලබාදීමේදී ආයතන ගණනාවක් සමග සම්බන්ධීකරණ කල යුතු වීම • අනපේක්ෂිත කාලගුණික තත්ත්වයන් වලට මුහුණ දීමට සිදු වීම . • අවතැන් වූ ප්‍රජාවගේ දුක්ගැනවිලි සහ ඉල්ලීම • තාක්ෂණික කාර්ය මණ්ඩල හිඟය (ඉංජිනේරුවන්, ඉංජිනේරු සහකාර, සැලසුම්කරු)

2. මොරාණ ජලාශ ව්‍යාපෘතිය

ඇස්තමේන්තු ගත මුදල	රු.මි. 2,900	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	බදුල්ල
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 16 හෙක්ටයාර 570
ව්‍යාපෘති කාලය	2012-2024	**ප්‍රතිලාභීන්**	පවුල් 1,300
කල් දිගු ලබාදීම්	2021/06/31 2023/12/31	**කල් දිගු ලබා දීමට හේතු**	නියමිත පරිදි ව්‍යාපෘතිය අවසන් වී නොතිබීම
ප්‍රතිපාදන 2024	රු.මි. 170	**2025 වසර සඳහා ප්‍රතිපාදන**	-
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 2773.95	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	99.64
2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 48.08		
2024 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන / දරන ලද වියදම	• ඉඩම් අත්පත් කර ගැනීම සහ ජලාශය සහ ඇළ සඳහා අත්පත් කරගත් දේපල සඳහා වන්දි ගෙවීම.		රු.මි. 48.08
2025 වසර සඳහා යෝජිත වැඩසටහන	-		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• ඉඩම් හෙක්ටයාර 570කට සහ පවුල් 1300කට වාරි ජලය සැපයීම. • පවුල් 500කට පානීය ජලය සැපයීම. • කිලෝමීටර් 25ක මාර්ගයක් ඉදිකිරීම. • මීමැසි පාලනය හා මිරිදිය ධීවර කර්මාන්තය සම්බන්ධ වැඩසටහන් පැවැත්වීම. • ප්‍රදේශයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම • නැවත වන වගා වැඩසටහන.		
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	• නව සහ පවතින ඉඩම් හෙක්ටයාර 449ක් සඳහා වාරි පහසුකම් සැපයීම සහ ගොවි පවුල් 1000ක් සඳහා ප්‍රතිලාභ ලබා දීම. • පවුල් 500කට පානීය ජලය සහ මොරාන, මහළුනුක, කුඩාලුණුක, තිස්සපුර, අලුකැටියාව සහ යාල්වෙල ග්‍රාම සේවා කොට්ඨාසයේ ප්‍රදේශවලට ගෘහාශ්‍රිත ජලය සැපයීම. • ජනතාවගේ ජීවනෝපාය කටයුතු වැඩිදියුණු කිරීම		
අපේක්ෂිත පරිදී නිම කිරීමට නොහැකි වීමට හේතු	• තක්සේරු කිරීම ප්‍රමාද වීම හේතුවෙන් වන්දි ගෙවීම ප්‍රමාද විය. • සංවර්ධනය සඳහා ඉඩම් නිදහස් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් වාරිමාර්ග ඉඩම් සංවර්ධන කටයුතු ප්‍රමාද විය.		
අභියෝග	• විකල්ප ඉඩම් සඳහා ඉඩම් නිදහස් කර ගැනීම. . • ඉඩම් කටයුතු සඳහා අනිකුත් ආයතන සමඟ සම්බන්ධීකරණය. • අවතැන් වූ ප්‍රජාවගේ දුක්ගැනවිලි විසඳීම.		

3. ඇල්ල වැව ජලාශය

ඇස්තමේන්තු ගත මුදල	රු.මි. 2,950.00	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	රත්නපුර
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 1.91 පවතින ඉඩම් හෙක්ටයාර 456 ක් සහ නව ඉඩම් හෙක්ටයාර 141.6 ක්
ව්‍යාපෘති කාලය	2021-2024	**ප්‍රතිලාභීන්**	පවුල් 4,000
කල් දිගු ලබාදීම්	2024 – 2026	**කල් දිගු ලබා දීමට හේතු**	නියමිත පරිදි ව්‍යාපෘතිය අවසන් වී නොතිබීම
ප්‍රතිපාදන 2024	රු.මි. 500	**2025 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 1,000.00
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 474.72	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	35.57
2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 173.17		
2024 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන / දරන ලද වියදම	• ප්‍රධාන බැම්මේ ඉදිකිරීම් 26%ක් අවසන් කර ඇත. • සොරොව්වේ වැඩ කටයුතු 65% කින් අවසන් කිරීම. • 2 වන බැම්මේ ඉදිකිරීම් 66%ක් අවසන් කර ඇත. • ප්‍රාරම්භක වැඩ		රු.මි. 53.25 රු.මි. 28.12 රු.මි. 88.80 රු.මි. 3.00
2025 වසර සඳහා යෝජිත වැඩසටහන	• ප්‍රධාන වේල්ල ඉදිකිරීම • සොරොව්ව සහ පහළ පිටවාන ඉදිකිරීම • වේල්ල අංක 02 ඉදිකිරීම • වේල්ල අංක 03 ඉදිකිරීම • වාන් නිර්මිතය ඉදිකිරීම • නැවත පදිංචි කිරීම, වන්දි ගෙවීම සහ යටිතල පහසුකම් සැපයීම • පහළ නිම්න සංවර්ධන කටයුතු සිදුකිරීම		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• කෘෂිකාර්මික හා ගෘහාශ්‍රිත කටයුතු සඳහා ජලය සැපයීමෙන් ප්‍රදේශයේ වෙසෙන ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම. • වියළි කාලවලදී වාරි කෘෂිකර්මාන්තය සඳහා ජල සුරක්ෂිතතාව සහතික කිරීම. • දැනට පවතින හුලංදාව සහ පනාමුර යෝජනා ක්‍රමයේ භෝග තීව්‍රතාවය වැඩි කිරීම සහ ජලය සැපයිය හැකි ප්‍රදේශය අක්කර 350කින් පුළුල් කිරීම. • කොලොන්න ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා පානීය ජල ඉල්ලුම දිනකට ඝන මීටර 7,000ක් සැපයීම. • මිරිදිය ධීවර කර්මාන්තයට සහ පාරිසරික අවශ්‍යතාවලට දායකත්වය සැපයීම.		
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	කොළොන්න ජල යෝජනා ක්‍රමය යටතේ පානීය ජල සම්බන්ධතාව දීර්ඝ කරමින් පවතී		

අපේක්ෂිත පරිදි නිම කිරීමට නොහැකි වීමට හේතු	• 2021 දී කෝවිඩ් වසංගතය හේතුවෙන් වැඩබිම වසා තැබීම • 2022 දී ආර්ථික අර්බුදය හේතුවෙන් ඉන්ධන සහ ඉදිකිරීම් ද්‍රව්‍ය සීමා වීම සහ ද්‍රව්‍ය මිල විශාල ලෙස ඉහළ යාම. • 2022/2023 දී ව්‍යාපෘති අත්හිටුවීම සඳහා RAMP කමිටුවෙන් ලබා දී තිබූ තීරණය. • 2024 වසරේදී ප්‍රධාන වේල්ල සඳහා පස් සපයා ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාදය.
අභියෝග	• ප්‍රධාන වේල්ලේ පාදම සඳහා අවශ්‍ය මැටි සහ වේල්ලේ ඉදිකිරීම් සඳහා සුදුසු වන පස් ප්‍රදේශයේ නොමැතිකම. • ප්‍රාදේශීය මාර්ග ඔස්සේ ද්‍රව්‍ය ප්‍රවාහන ගැටලුව. • වැඩබිමේ ස්වභාවය හේතුවෙන් ඉදිකිරීම් ඉඩකඩ සීමා වීම.

4. මුන්දෙනි ආරු ගංඟාද්‍රෝණි සංවර්ධන ව්‍යාපෘතිය (රූගම් කිතුල්)

ඇස්තමේන්තු ගත මුදල	රු.මි. 24,141	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	අම්පාර සහ මඩකලපුව
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය + විදේශීය ණය	**ජලාශ ධාරිතාව / වගා භූමි ප්‍රමාණය**	රූගම් කිතුල් - ඝන මීටර මිලියන 58 මහ ඔය - ඝන මීටර මිලියන 80 හෙක්ටයාර 6,500
ව්‍යාපෘති කාලය	අවුරුදු 06 2021 – 2027	**ප්‍රතිලාභීන්**	පවුල් 50,000
කල් දිගු ලබාදීම්	-	**කල් දිගු ලබා දීමට හේතු**	-
ප්‍රතිපාදන 2024	ශ්‍රී ලංකා ජනරජය - රු.මි. 110	**2025 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 100
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 384.16	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	2.32
2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 21.93		
2024 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන / දරන ලද වියදම	ඉඩම් අත්පත් කර ගැනීමේ මූලික කටයුතු සිදු කිරීම		රු.මි. 21.9
2025 වසර සඳහා යෝජිත වැඩසටහන	• ඉඩම් අත්පත් කර ගැනීම සහ නැවත පදිංචි කිරීමේ කටයුතු • පූර්ව සැලසුම් වැඩ • මිනින්දෝරු දෙපාර්තමේන්තු මගින් ඉඩම් අත්පත් කර ගැනීමේ අවසන් සිතියම් පිළියෙළ කිරීම. • නැවත පදිංචි කිරීමේ ප්‍රදේශයේ පූර්ව ප්‍රවේශ කටයුතු සිදු කිරීම.		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• පවුල් 10,000කට අයත් වගා කළ හැකි සහ වගා කටයුතු සිදු කරන ඉඩම් හෙක්ටයාර 6,500ක් සඳහා වාරි පහසුකම් සපයා දීම. • මඩකලපුව සහ අම්පාර දිස්ත්‍රික්කයේ පවුල් 31,000කට පානීය ජලය සැපයීම.		

	• පහළ නිම්නයේ ගංවතුර පාලනය කිරීම. • ජලාශ දෙකෙහිම මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය වසරකට මෙට්‍රික් ටොන් 800කින් වැඩි කිරීම. • කිලෝමීටර් 85ක මාර්ග ජාලයක් ඉදිකිරීම. • නගර සංවර්ධනය කිරීම. • අලි වැට ඉදිකිරීම. • නැවත වන වගා වැඩසටහන. • ආදායම් උත්පාදනය කිරීමේ වැඩසටහන් සහ පුහුණුව (කෘෂිකාර්මික හා පශු සම්පත් ව්‍යාප්තිය).
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	මේ වනතුරු ප්‍රතිලාභ ලැබී නොමැත.
අපේක්ෂිත පරිදි නිම කිරීමට නොහැකි වීමට හේතු	අරමුදල් සපයන ආයතනය සමඟ මෙතෙක් ණය ගිවිසුමක් අත්සන් කර නොමැත.
අභියෝග	• ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අරමුදල් සොයා ගැනීම. • ඉඩම් අත්පත් කර ගැනීමේ පටිපාටියේ දුෂ්කරතා.

5. කැළණි ගඟ ආරක්ෂණ බැම්ම ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය

ඇස්තමේන්තු ගත මුදල	රු.මි. 1000	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	කොළඹ, ගම්පහ
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	-
ව්‍යාපෘති කාලය	2018-2024	**ප්‍රතිලාභීන්**	පවුල් 15,000ක් පමණ
කල් දිගු ලබාදීම්	2020/12/31 සිට 2024/12/31දක්වා	**කල් දිගු ලබා දීමට හේතු**	රටේ පැවති අර්බුදකාරී තත්වය නිසා සැලසුම් කළ පරිදි වැඩ කරගත නොහැකි වීම
ප්‍රතිපාදන 2024	රු.මි. 670	**2025 වසර සඳහා ප්‍රතිපාදන**	-
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 601.104	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	56.01
2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 139.57		
2024 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන / දරන ලද වියදම	• කැලණි ගඟ ගංවතුර ආරක්ෂණ බැම්ම ප්‍රතිසංස්කරණය කිරීම. • කැළණි ගඟ ඉවුරු ආරක්ෂණය • ගංවතුර ආරක්ෂණ නිර්මිත වැඩි දියුණු කිරීම. • ඉඩම් අත්පත් කර ගැනීම සඳහා වන්දි මුදල් ගෙවීම.		රු.මි 0.626 රු.මි 61.723 රු.මි 6.307 රු.මි 70.918
2025 වසර සඳහා යෝජිත වැඩසටහන	-		

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• කැළණි ගඟ ආශ්‍රිතව පවුල් 15,000කගේ පමණ ජීවිත හා ඔවුන්ගේ දේපළ, කර්මාන්ත, මාර්ග හා යටිතල පහසුකම් ගංවතුරෙන් ආරක්ෂා කිරීම.
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	• කැළණි ගඟ ඉවුරු සංරක්ෂණය - කොහිලවත්ත සුසාන භූමිය බාදනය වීමෙන් ජල මූලාශ්‍රයට සිදුවෙමින් පැවති පාරිසරික හානිය වැලකීම සහ ඉවුරු බාදනය අවම කිරීම මඟින් යාබද පොදු ස්ථාන වල ආරක්ෂාව තහවුරු කිරීම, කළුඅග්ගල - අකරවිට මාර්ගය පරිහරණය කරන්නන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම • ගංවතුර වේලි ආරක්ෂණය - කැළණි උතුරු වේල්ලේ වැඩ නිම කරන ලද කි.මී. 1.5 පමණ දුර ප්‍රදේශය ආශ්‍රිතව සිටින ජනතාවගේ දේපල සහ ජීවිත ආරක්ෂා වීම (කි.මී. 2.5ක් පමණ දිග ප්‍රමාණයක වැඩ සිදු කෙරෙමින් පවතී)
අපේක්ෂිත පරිදි නිම කිරීමට නොහැකි වීමට හේතු	• ව්‍යාපෘතිය ආරම්භයේදී ඇස්තමේන්තු සකස් කර වැඩ ආරම්භ කරන අවස්ථාවේදී ඇති වූ කොවිඩ් වසංගතය හේතුවෙන් සහ ඒ සමඟ රට තුල ඇති වූ ආර්ථික අර්බුධකාරී තත්වය නිසා ඉදිකිරීම් ද්‍රව්‍ය වල සීඝ්‍ර මිල විචලනයක් සිදු විය. • එම හේතුවෙන් ඇස්තමේන්තු නැවත සංශෝධනය කිරීමට සිදු වීමත් ප්‍රමාණවත් කාර්යය මණ්ඩලය නොමැති වීමත් නිසා ඇස්තමේන්තු යාවත්කාලීන කර ගැනීමේ ගැටළු පැන නැගීම, අනවසර ඉදිකිරීම් ඉවත් කර ගැනීමේ ගැටළු සහ ඉඩම් අත්පත් කර ගැනීමේ ගැටළු පැවතීම.
අභියෝග	• ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති වීම • අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම සහ ඉඩම් අත්පත් කර ගැනීමේ ගැටළු

6. ගොඩිගමුව ව්‍යාපෘතිය සංවර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම.

ඇස්තමේන්තු ගත මුදල	රු.මි. 357	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	මාතලේ
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 0.25 හෙක්ටයාර 119
ව්‍යාපෘති කාලය	2018-2024	**ප්‍රතිලාභීන්**	පවුල් 265 පමණ
කල් දිගු ලබාදීම් 2021 - 2023 2023 - 2024		**කල් දිගු ලබා දීමට හේතු**	• භූගෝලීය සහ සමාජ අවශ්‍යතා අනුව ව්‍යාපෘති යෝජනාවේ සිදුකළ වෙනස්කම් • නියමිත වේලාවට අරමුදල් නොලැබීම • Covid 19 වසංගතය • ආර්ථික අර්බුදය සහ ඉදිකිරීම් ද්‍රව්‍ය හිඟතාවය
ප්‍රතිපාදන 2024	රු.මි. 60	**2025 වසර සඳහා ප්‍රතිපාදන**	-
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 225.37	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	61.40

2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 25.92	
2024 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන / දරන ලද වියදම (රු.මි)	• වැව් බැම්ම ඉදිකිරීම • රළපනාව (Rip rap) හා දියපෙරනය (Toe Filter) ඉදිකිරීම • පිටවාන ඉදිකිරීම • වම් ඉවර සොරොව්ව ඉදිකිරීම • අමුණ ඉදිකිරීම • මූලික වැඩ	රු.මි. 3.70 රු.මි. 14.47 රු.මි. 4.79 රු.මි. 1.97 රු.මි. 0.57 රු.මි. 0.42
2025 වසර සඳහා යෝජිත වැඩසටහන	• රළපනාව සහ දිය පෙරනය ඉදිකිරීම • ප්‍රධාන ඇළ සහ අදාල ක්ෂේත්‍ර සඳහා වාරිමාර්ග වැඩිදියුණු කිරීම • අමුණ ඉදිකිරීම • පෝෂක ඇල ඉදිකිරීම	
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• නව කුඹුරු ඉඩම් හෙක්ටයාර 119 සඳහා වාරි පහසුකම් සැපයීම • ගොවීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නංවන අතර ජාතියේ ආහාර නිෂ්පාදනයට දායක වීම	
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	අක්කර 28ක් යල කනන්නයේ වගා කරන ලදී.	
අපේක්ෂිත පරිදි නිම කිරීමට නොහැකි වීමට හේතු	සැප්තැම්බර් මසදී ප්‍රතිපාදන ලැබීම සහ වර්ෂාපතනය	
අභියෝග	• කුඩා වර්ෂාපතනයකදී පවා වැඩ කළ නොහැකි තත්වයට භූමිය පත් වීම. • අනපේක්ෂිත වර්ෂාපතනය	

7. උමා ඔය පහළ නිම්න සංවර්ධන ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 17,914.19	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	මොණරාගල, හම්බන්තොට
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව / වගා භූමි ප්‍රමාණය**	අලිකොට ආර - ඝන මීටර මිලියන 6.5 කුඩා ඔය - ඝන මීටර මිලියන 22.6 හඳපානාගල - ඝන මීටර මිලියන 14 නව ඉඩම් හෙක්ටයාර 4500 සහ පවතින ඉඩම් හෙක්ටයාර් 1500
ව්‍යාපෘති කාලය	2013 -2024	**ප්‍රතිලාභීන්**	පවුල් 5,700
කල් දිගු ලබාදීම්	2022/12/31 2024/12/31	**කල් දිගු ලබා දීමට හේතු**	නියමිත පරිදි ව්‍යාපෘතිය අවසන් වී නොතිබීම
ප්‍රතිපාදන 2024	රු.මි. 3,414	**2025 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 150
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 17,689.01	**සමස්ත භෞතික ප්‍රගතිය (%)**	97.44

2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 2,558.61	
2024 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන / දරන ලද වියදම	• කුඩාඔය ජලාශය ඉදිකිරීම – 95% • අලිකොට ආර -කුඩාඔය ඇළ ඉදිකිරීම – 72% • කුඩාඔය - සිංහලයාගම ඇළ ඉදිකිරීම – 70 % • හඳපානාගල අමුණ – 100% • ඉඩම් අත්පත් කර ගැනීම, නැවත පදිංචි කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය සහ නැවත වන වගාව – 100% • ඉඩම් අහිමි වූ ජනතාව සඳහා විශේෂ දීමනාවක් ගෙවීම. • ගම්බද වාරි පද්ධති සංවර්ධනය.	රු.මි. 267.78 රු.මි. 1,916.03 රු.මි. 293.22 රු.මි. 36.64 රු.මි. 16.27 රු.මි. 21.46 රු.මි. 5.01
2025 වසර සඳහා යෝජිත වැඩසටහන	• කුඩාඔය ජලාශය ඉදිකිරීම අවසන් කිරීම. • අලිකොටආර සිට කුඩාඔය හරස් ඇල ඉදිකිරීම අවසන් කිරීම. • කුඩාඔය සිට සිංහලයාගම හරස් ඇල ඉදිකිරීම අවසන් කිරීම. • වැල්ලවාය සහ තණමල්විල ප්‍රදේශවල නව පෝෂිත ඇල පද්ධතියක් ඉදිකිරීම.	
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• උමා ඔය ද්‍රෝණියේ සිට කිරිඳි ඔය ද්‍රෝණියට වාර්ෂිකව සත මීටර මිලියන 145 ජලය සැපයීම. • නව ඉඩම් හෙක්ටයාර 4500 කට සහ දැනට පවතින ඉඩම් හෙක්ටයාර 1500 කට ජලය සැපයීම. • මොනරාගල සහ හම්බන්තොට දිස්ත්‍රික්ක සඳහා සත මීටර මිලියන 30 පානීය හා කාර්මික ජලය සැපයීම. • සත්ත්ව ගොවිපොළ සහ මිරිදිය ධීවර සංවර්ධනය • නවීන තාක්ෂණයේ දැනුම හුවමාරු කිරීම • කුඩා වැව් 54ක් වැඩි දියුණු කිරීම සහ වැව් 110කට ජලය සැපයීම	
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	• හඳපානාගල වම් සහ දකුණු ඉවුරු ඇල මගින් යල සහ මහ කන්න සඳහා අක්කර 1553 ක් සඳහා වාරි ජලය සැපයීම. • අලිකොට ආර හැරවුම් ඇල මාර්ගය යටතේ යල සහ මහ කන්න සඳහා අක්කර 2396 ක් සඳහා වාරි ජලය සැපයීම. • කුඩා ඔය - සිංහලයාගම හැරවුම් ඇල මාර්ගය යටතේ යල කන්නය සඳහා අක්කර 6625 ක් සහ මහ කන්නය සඳහා අක්කර 8709 ක් සඳහා වාරි ජලය සැපයීම. • හඳපානාගල සහ අලිකොට ආර ජලාශ වල ධීවර සමිති පිහිටවා මිරිදිය මත්ස්‍ය කර්මාන්තය සිදුකරමින් පවතී. • කුඩා වැව් 50 ක් වැඩි දියුණු කිරීම • ව්‍යාපෘතිය සෘජු ශ්‍රමය යටතේ සිදුකල බැවින් හම්බන්තොට සහ මොණරාගල දිස්ත්‍රික්ක වල පුහුණු ශ්‍රමිකයන් විශාල ප්‍රමාණයක් බිහි වීම.	
අපේක්ෂිත පරිදී නිම කිරීමට නොහැකි වීමට හේතු	• COVID 19 වසංගතය, ආර්ථික අර්බුදය නිසා ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම සහ අපේක්ෂිත ප්‍රතිලාභ ලගා කර ගැනීමට ප්‍රමාද වීම. • RAMP කමිටු තීරණ අනුව ඉදිකිරීම් සීමා කිරීමට සිදු වීම. • ආර්ථික අර්බුදය නිසා ඉදිකිරීම් ද්‍රව්‍ය හිඟ වීම සහ ඉන්ධන මිල ඉහල යාම.	
අභියෝග	• RAMP කමිටු තීරණ අනුව ඇස්තමේන්තු සංශෝධනය කිරීම් කල නොහැකි වීම.	

8. හිඹිලියාකඩ වත්තේගෙදර වාරිමාර්ග යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

ඇස්තමේන්තුගත මුදල	රු.මි. 7,155	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	මාතලේ
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව / වගා භූමි ප්‍රමාණය**	නව ඉඩම් හෙක්ටයාර 409 සහ පවතින ඉඩම් හෙක්ටයාර 526
ව්‍යාපෘති කාලය	2020-2024	**ප්‍රතිලාභීන්**	පවුල් 1,200
කල් දිගු ලබාදීම්	-	**කල් දිගු ලබා දීමට හේතු**	-
ප්‍රතිපාදන 2024	රු.මි.250	**2025 වසර සඳහා ප්‍රතිපාදන**	-
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 664.40	**සමස්ත භෞතික ප්‍රගතිය (%)**	6.26
2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය රු.මි.	රු.මි. 34.59		
2024 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන / දරන ලද වියදම	NOR කමිටු තීරණ අනුව හිඹිලියාකඩවැව ඉදිකිරීමේ කටයුතු අවසන් කිරීම		රු.මි. 34.07
2025 වසර සඳහා යෝජිත වැඩසටහන	-		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• පවතින ඉඩම් හෙක්ටයාර 526 කට හා නව ඉඩම් හෙක්ටයාර 409 කට ජලය සැපයීම. • වගා තීව්‍රතාවය 1 සිට 2 දක්වා වැඩි කිරීම. • සුරක්ෂිත පානීය ජලය සහ ගෘහස්ථ ජලය සැපයීම. එමගින් CKD (නිදන්ගත වකුගඩු රෝගය) වැනි සෞඛ්‍ය ගැටළු අවම කිරීම. • ගොවි පවුල්වල ආර්ථික තත්ත්වය ඉහල නැංවීම. • භූගත ජල මට්ටම ඉහළ නැංවීම • අලි මිනිස් ගැටුම් අවම කිරීම.		
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	හිඹිලියාකඩ වාරි යෝජනා ක්‍රමය යටතේ දැනට පවතින අක්කර 380 කට යල සහ මහ කන්නයේ ජලය සැපයීම.		
අපේක්ෂිත පරිදි නිම කිරීමට නොහැකි වීමට හේතු	• ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය එකඟ වූ පරිදි කළු ගඟ ජලාශයෙන් ජල සැපයුම ලබාදීම පසුව අවලංගු කිරීම. • කොවිඩ් වසංගතය හේතුවෙන් ඉදිකිරීම් ප්‍රමාද විය. • ආර්ථික අර්බුදය හේතුවෙන් ඉන්ධන සහ ඉදිකිරීම් ද්‍රව්‍ය හිඟය. • RAMP කමිටු හා NOR තීරණ. • භූමියේ පැවති සංකීර්ණ ගැටළු විසඳීමට නොහැකි නිසා ඊට ගැලපෙන ලෙස ව්‍යාපෘතිය යලි සැලසුම් කිරීම		
අභියෝග	• ව්‍යාපෘතියේ පරිමාණය අඩුවීම පිළිබඳව ප්‍රදේශයේ ජනතාවට ඒත්තු ගැන්වීම. • ප්‍රදේශය සඳහා වෙනත් වාරි සංවර්ධන කටයුතු සැලසුම් කර නොමැති වීම. • දුර බැහැර ප්‍රදේශවල සංවර්ධන කටයුතු සඳහා තාක්ෂණික කාර්ය මණ්ඩලය වෙන් කිරීම අපහසු වීම.		

9. පහළ මල්වතු ඔය බහු කාර්යය සංවර්ධන ව්‍යාපෘතිය

ඇස්තමේන්තු මුදල	රු.මි. 22,900	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	අනුරාධපුර, මන්නාරම සහ වවුනියාව
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 209 හෙක්ටාර 13,472
ව්‍යාපෘති කාලය	2016 - 2024	**ප්‍රතිලාභීන්**	අනුරාධපුර, මන්නාරම සහ වවුනියාව දිස්ත්‍රික්කවල ජීවත් වන ජනතාව
කල් දිගු ලබාදීම්	2025.12.31 (කල් දිගුව ඉල්ලා ඇත)	**කල් දිගු ලබා දීමට හේතු**	නියමිත පරිදි ව්‍යාපෘතිය අවසන් වී නොතිබීම
ප්‍රතිපාදන 2024	රු.මි. 2,700	**2025 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 5,000
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි.1,817.44	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	7.03
2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 608.22		
2024 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන / දරන ලද වියදම	• පස් බැම්ම ඉදිකිරීම සහ ඉතිරි වැඩ RB සොරොව්ව • නැවත පදිංචි කිරීමේ ප්‍රදේශයේ I,II යටිතල පහසුකම් සංවර්ධනය • අලුතින් යෝජිත වම් ඇල සහ දකුණු ඇල වාරිමාර්ග ප්‍රදේශය සඳහා සමීක්ෂණය සහ වෙන් කිරීම් සලකුණු කිරීම • පාරිසරික කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම විපතට පත් ජනතාව සඳහා ඉඩම් අත්පත් කර ගැනීම සහ වන්දි ප්‍රධාන කටයුතු • වාන් මාර්ගයේ වම් පස ඇති පාෂාණමය කොටස් පුපුරවා ඉවත් කිරීම (ආරම්භ කරන ලදී)	රු.මි. 358.20 රු.මි. 177.20 රු.මි. 4.10 රු.මි. 68.72
2025 වසර සඳහා යෝජිත වැඩසටහන	• පස් බැම්ම ඉදිකිරීම සහ දකුණු ඉවුර සොරොව්ව නිම කිරීම. • 0+000 සිට 0+225 දක්වා අරිය ගේට්ටු සහිත පිට වාන ඉදිකිරිම, වම් ඉවුර සොරොව්ව සහ බලාගාරයේ පිවිසුම් නලය ඉදිකිරීම (පාදම ශක්තිමත් කිරීම සඳහා ප්‍රතිකාර කටයුතු ඇතුළුව) • නැවත පදිංචි කිරීමේ ප්‍රදේශයේ යටිතල පහසුකම් සංවර්ධනය • යෝජිත වම් සහ දකුණු ඉවුරු වගා බිම් වල සංවර්ධනය • පාරිසරික කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම • ඉඩම් අත්පත් කර ගැනීම සහ වන්දි ලබා දීම. • පිටවාන් මාර්ගයේ වම් ඉවුරේ ගල් ඉවත් කිරීම	

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• නව වාරි ප්‍රදේශ හෙක්ටයාර 810 ක් (වී සහ අතුරු බෝග) සඳහා වාරි පහසුකම් සැපයීම. • පවතින වාරි ප්‍රදේශ හෙක්ටයාර 12,416 ක් (යෝධ වැව සහ අකතිමුරිප්පු වැව) සඳහා වාරි පහසුකම් සැපයීම. • වවුනියාව, මන්නාරම සහ අනුරාධපුර දිස්ත්‍රික්ක වල වාර්ෂික ගෘහස්ථ ජල ඉල්ලුම සපුරාලීම සඳහා ජලය 21 MCM සැපයීම. • වාර්ෂිකව ව්‍යාපෘතිය හරහා ජනනය කෙරෙන 4.68 GWh ක විදුලිය ජාතික විදුලිබල පද්ධතියට එක් කිරීම. • නව නගර සැලසුම් ව්‍යාපෘතිය යටතේ තන්තිරිමලේ නගරය සංවර්ධනය කිරීම. • වවුනියාව සහ මන්නාරම දිස්ත්‍රික්කවල ගංවතුර අවම කිරීම. • සූර්ය බලශක්ති ව්‍යාපෘති හඳුන්වා දීම • ධීවර හා ජලජ සම්පත් සංවර්ධනය. • අභ්‍යන්තර මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම • විල්පත්තු ජාතික වන රක්ෂිතයේ නැවත වන වගාව සහ සංරක්ෂණය.
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	• ව්‍යාපෘතිය තුළ දේශීය සේවකයින් සඳහා නව රැකියා අවස්ථා ලැබීම. • සේවා සැපයුම් කරුවන්ගේ ආර්ථික මට්ටම ඉහළ නැංවීම.
අපේක්ෂිත පරිදි නිම කිරීමට නොහැකි වීමට හේතු	• අපේක්ෂිත අර මුදල් නිකුත් කිරීමේ ප්‍රමාදයන්. • ප්‍රධාන රජයේ දෙපාර්තමේන්තු වලින් (උදා: පතල් බලපත්‍ර සඳහා GSMB, වන හා වනජීවී බලධාරීන්) අනුමැතිය ලබා ගැනීමේදී අනවශ්‍ය ප්‍රමාදයන්. • වාන් නිර්මිතය ඉදිකිරීම වැනි ව්‍යාපෘති විෂය පථයේ නිතර සිදුවන වෙනස්කම්.
අභියෝග	• ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) අවලංගු කිරීම හේතුවෙන් මූල්‍ය, ප්‍රසම්පාදන සහ කාර්ය මණ්ඩල සීමාවන්ට බාධාවන් සිදුවීම. • බදවා ගැනීම් සීමා කිරීම් හේතුවෙන් පුහුණු කාර්ය මණ්ඩලය සීමිත වීම. • විෂය පථය වරින් වර වෙනස් වීම.

10. තල්පිටිගල ජලාශ ව්‍යාපෘතිය

ඇස්තමේන්තුගත මුදල	ඇ .ඩො.මි. 174	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	බදුල්ල/මහනුවර
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	1. මූලස්ථායී වැඩ - විදේශීය (අපේක්ෂිත) 2. ප්‍රාරම්භක වැඩ - දේශීය	**ජලාශ ධාරිතාව (ඝන මීටර මිලියන)/ වගා තීව්‍රතාවය (හෙක්ටයාර්)**	ඝන මීටර මිලියන 15.56 බත්මැඩිල්ල ව්‍යාපාරයේ පවතින හෙක්ටයාර 810 සහ නව හෙක්ටයාර 400ක්, මිනිපේ වම් ඉවුර ව්‍යාපාරයේ අර්ධ වශයෙන් හෙක්ටයාර 8000ක්
ව්‍යාපෘති කාලය	2018-2024	**ප්‍රතිලාභීන්**	සෘජු පවුල් 10,000
කල් දිගු ලබාදීම්	-	**කල් දිගු ලබා දීමට හේතු**	-
ප්‍රතිපාදන 2024	රු.මි.500.00	**2025 වසර සඳහා ප්‍රතිපාදන**	-
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 734.20	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	11.56
2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 86.96		
2024 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන / දරන ලද වියදම	• යාලගමුව මාර්ගය වැඩිදියුණු කිරීම. • ඉඩම් අත්පත් කර ගැනීමේ මූලික කටයුතු අවසන් කිරීම. • අනෙකුත් වියදම්		රු.මි. 78.50 රු.මි. 0.12 රු.මි. 8.34
2025 වසර සඳහා යෝජිත වැඩසටහන	ප්‍රතිපාදන ලබාදී නොමැත		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• මිනිපේ වම් ඉවුර ඇතුළු නව ඉඩම් හෙක්ටයාර 400ක් සඳහා ජලය සැපයීම සහ පවතින ඉඩම් හෙක්ටයාර 810ක් සඳහා අඛණ්ඩව ජලය සැපයීම • ජල විදුලි උත්පාදනය මඟින් වාර්ෂික ගිගා වොට් පැය 51.6ක් ජාතික විදුලි පද්ධතියට එක් කිරීම • පානීය ජලය සැපයීම • ධීවර කර්මාන්තය දියුණු කිරීම • ඌව පරණගම සිට කන්දකැටිය දක්වා මාර්ගය වේල්ල මතින් ඉදිකිරීමෙන් දුර ප්‍රමාණය කි.මී. 70ක් පමණ අඩු වීම • මහවැලි පද්ධතියට රොන්මඩ එකතු වීම පාලනය කිරීම		
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	ඌව පරණගම සිට කන්දකැටිය දක්වා මාර්ගයක් ඉදිකිරීම.		
අපේක්ෂිත පරිදී නිම කිරීමට නොහැකි වීමට හේතු	ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීමට අරමුදල් නොමැත		
අභියෝග	ව්‍යාපෘතියේ මූලස්ථායී වැඩ ආරම්භ කිරීමට අවශ්‍ය මුදල් සොයා ගැනීම		

11. බැරැක් ප්ලේන් සංවර්ධන ව්‍යාපෘතිය

ඇස්තමේන්තු මුදල	රු.මි. 230	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	නුවරඑළිය
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව / වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 0.12 හෙක්ටයාර 800
ව්‍යාපෘති කාලය	2021 - 2024	**ප්‍රතිලාභීන්**	පවුල් 3,000
කල් දිගු ලබාදීම්		**කල් දිගු ලබා දීමට හේතු**	-
ප්‍රතිපාදන 2024	රු.මි. 100	**2025 වසර සඳහා ප්‍රතිපාදන**	-
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 135.33	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	52.54
2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි.27.45		
2024 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන / දරන ලද වියදම	• වැවෙහි රොන්මඩ කැණීම සහ ඉවත් කිරීම • පෝෂක ඇල ප්‍රතිසංස්කරණය කිරීම • වැව අවට පාංශු සංරක්ෂණ පිළිවෙත් හඳුන්වා දීම (වැව වටා ප්‍රවේශ මාර්ගයක් සැකසීම) • ජලාපවහන ඇතුල්වීමේ නිර්මිත (Drainage Inlets) ඉදිකිරීම • මායිම් ගල් ස්ථාපනය කිරීම	රු.මි. 0.69 රු.මි. 2.51 රු.මි. 6.02 රු.මි. 17.90 රු.මි.0.33	
2025 වසර සඳහා යෝජිත වැඩසටහන	• වැවෙහි රොන්මඩ කැණීම සහ ඉවත් කිරීම • පෝෂක ඇල ප්‍රතිසංස්කරණය කිරීම • වැව අවට පාංශු සංරක්ෂණ පිළිවෙත් හඳුන්වා දීම (වැව වටා ප්‍රවේශ මාර්ගයක් සැකසීම) • වැවට රොන් මඩ ගලා ඒම නැවැත්වීමට නව ක්‍රම හඳුන්වා දීම • ජලාපවහන ඇතුල්වීම් ඉදිකිරීම • වේල්ලෙහි සුළු අලුත්වැඩියාවන් සිදුකිරීම • වැව අවට පාංශු බාදනය අවම කිරීම සඳහා භූමි අලංකරණය • මායිම් ගල් ස්ථාපනය කිරීම		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• වාරි ජලය හෙක්ටයාර් 912 (බැරැක් ප්ලේන් වැව යටතේ හෙක්ටයාර් 101 එළවළු, බෝඹුරු ඇල්ල වැව හෙක්ටයාර 811 වී සහ එළවළු) • පවුල් 3000ක් සඳහා පානීය ජලය සපයීම		
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	• යල කන්නයේ හෙක්ටයාර 455 ක් සහ මහ කන්නයේ හෙක්ටයාර 910ක් සඳහා වාරි ජලය සැපයීම • දිනකට ඝන මීටර් 3,000 ක් පානීය ජල සැපයීම.		
අපේක්ෂිත පරිදි නිම කිරීමට නොහැකි වීමට හේතු	වැව් සීමාවට අදාල ඉඩම් සඳහා අභියාචනාධිකරණයේ නඩුවක් පැවතීම සහ අධික වර්ෂාපතනය		
අභියෝග	• අනපේක්ෂිත වර්ෂාපතනය සහ හදිසි ගංවතුර • අනවසර ලෙස ඉඩම් අල්ලාගැනීම්		

12. ඒරු වැව - මහකනදරාව පෝෂිත ඇල ව්‍යාපෘතිය

ඇස්තමේන්තු මුදල	රු.මි. 2,000	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	අනුරාධපුරය
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව / වගා භූමි ප්‍රමාණය**	• මහකනදරාව (වාන එසවීමෙන් පසු) - ස.මී.මි 47.39, හෙක්ටයාර 1658 • ඒරු වැව (වාන එසවීමෙන් පසු) - ස.මී.මි 7.57, හෙක්ටයාර 85
ව්‍යාපෘති කාලය	2024-2026	**ප්‍රතිලාභීන්**	ගොවි පවුල් 5237 සහ පවුල් 20,000ක් සඳහා පානීය ජල පහසුකම් සැපයීම.
කල් දිගු ලබාදීම්	-	**කල් දිගු ලබා දීමට හේතු**	-
ප්‍රතිපාදන 2024	රු.මි. 1,000	**2025 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 500.00
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 375.789	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	12.2
2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	375.789		
2024 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන / දරන ලද වියදම	• ඒරුවැව වැව වැඩිදියුණු කිරීම. (වාන් එසවීම, නව වාන් ගේට්ටු සවිකිරීම,වැව් බැම්මට ප්‍රවේශ මාර්ග ඉදිකිරීම) • ඒරුවැව සිට මුද්දිරිප්පුව වැව පෝෂක ඇල සඳහා කි.මී. 0+000 ස්ථානයේ ජලය පිටවන නිර්මිතය ඉදිකිරීම. (100% සම්පූර්ණ කර ඇත) • ඒරුවැව සිට මුද්දිරිප්පුව වැව දක්වා පෝෂිත ඇල වැඩිදියුණු කිරීම.(42% සම්පූර්ණ කර ඇත) • මුද්දිරිප්පුව සහ මහනොච්චිකුලම වැව් වැඩිදියුණු කිරීම් (40% අවසන්) • මුද්දිරිප්පුව වැවේ සිට මහනොච්චිකුලම දක්වා පෝෂිත ඇල වැඩිදියුණු කිරීම. (40% සම්පූර්ණ කර ඇත) • මහකනදරාව මූලස්ථායී වැඩ වැඩිදියුණු කිරීම. • මිනුම් කිරීම සහ විමර්ශන කටයුතු • අනෙකුත් වියදම්	රු.මි. 60.02 රු.මි. 129.26 රු.මි. 38.24 රු.මි. 74.35 රු.මි. 25.51 රු.මි. 1.16 රු.මි. 47.26	

2025 වසර සඳහා යෝජිත වැඩසටහන	• ඉඩම් අත්පත් කර ගැනීම. • මැනුම්, විමර්ශන සහ ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම • ඒරුවැව සිට මුද්දිරිප්පුව වැව දක්වා පෝෂිත ඇල වැඩිදියුණු කිරීම. • මුද්දිරිප්පුව වැවේ සිට මහනොච්චිකුලම දක්වා පෝෂිත ඇල වැඩිදියුණු කිරීම. • මුද්දිරිප්පුව සහ මහනොච්චිකුලම වැව් ඉතිරි වැඩ කොටස් අවසන් කිරීම. • මහකනදරාව මූලස්ථායී වැඩ සිදුකිරීම. • මහනොච්චිකුලම සිට කනදරා ඔය දක්වා පෝෂිත ඇල වැඩිදියුණු කිරීම
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• මහකනදරාවේ වගා තීව්‍රතාවය 1.6 සිට 2 දක්වා වැඩි කිරීම. • පානීය ජල පහසුකම් සඳහා ජලය සැපයීම. • ඒරුවැව සහ මහකනදරාව ධීවර කර්මාන්තය ඉහල නැංවීම.
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	• වගා තීව්‍රතාවය 1.6 - 1.8 පමණ දක්වා වැඩි වීම. • ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය සඳහා ජලය සැපයීම - 80% අවසන්.
අපේක්ෂිත පරිදී නිම කිරීමට නොහැකි වීමට හේතු	• වෙනත් ආයතනවලින් (පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව) අවසර ලබා ගැනීම හේතුවෙන් ඉදිකිරීම් ප්‍රමාද වීම. • අසාමාන්‍ය කාලගුණ හේතුවෙන් ඉදිකිරීම් ප්‍රමාද වීම සහ වගා තීව්‍රතාවය වැඩි කිරීම සඳහා බාධා පැමිණීම.
අභියෝග	• පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වැනි වෙනත් ආයතනවලින් නිෂ්කාශන ලබාගැනීමේ දුෂ්කරතා. • වන සතුන්ගෙන් සිදුවන බලපෑම්.

13. තෝරාගත් මහා වාරිමාර්ග ව්‍යාපෘති වල අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු (ERIMIS)

ඇස්තමේන්තුගත මුදල		**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	සියලුම කලාප	
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව / වගා භූමි ප්‍රමාණය**	-	
ප්‍රතිපාදන 2024	රු.මි. 1,767.40	**2025 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 4000.00	
2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 1,597.06	**2024 වර්ෂයේ භෞතික ප්‍රගතිය (%)**	91.**0**	
කලාප අනුව ප්‍රගතිය	**කලාපය**	**2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය (රු.මි.)**	**සමස්ත භෞතික ප්‍රගතිය (%)**	**2025 වසර සඳහා ප්‍රතිපාදන (රු.මි.)**
	අම්පාර	209.1	75.0	71.0
	අනුරාධපුරය	132.7	92.4	45.0
	බදුල්ල	91.4	100.0	22.0
	මඩකලපුව	163.8	100.0	34.0
	කොළඹ	19.2	76.4	22.0
	ගාල්ල	56.7	80.0	30.0
	හම්බන්තොට	237.5	95.6	45.0
	මහනුවර	84.2	94.7	22.0
	කුරුණෑගල	88.8	92.3	34.0
	මන්නාරම	64.6	72.2	30.0
	මොණරාගල	99.5	100.0	22.0
	පොලොන්නරුව	71.4	91.5	55.0
	පුත්තලම	107.7	92.3	34.0
	ත්‍රිකුණාමලය	162.5	97.7	34.0
2024 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන / දරන ලද වියදම	ඉදිකිරීම් වැඩ 554 අදාළ ඉදිකිරීම් කටයුතු සිදුකර ඇත			රු.මි. 1,597.06
2025 වසර සඳහා යෝජිත වැඩසටහන	මහා වාරිමාර්ග ව්‍යාපෘති වල ඇති ඇළ මාර්ග සහ නිර්මිත ප්‍රතිසංස්කරණය කිරීම.			
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• ඇල මාර්ග වල ජල හානිය අවම කිරීම • ජල පාලනය විධිමත් කිරීම • අවශ්‍ය ජල ප්‍රමාණයන් නියමිත පරිදි වගා ඉඩම් සඳහා ලබා දීම • ඇල මාර්ග වල ස්ථායිතාවය වැඩි කිරීම			
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	• තෝරා ගත් ඇල මාර්ග වල ජල හානිය අවම කිරීම • තෝරා ගත් ඇල මාර්ග වල ජල පාලනය විධිමත් කිරීම • අවශ්‍ය ජල ප්‍රමාණයන් නියමිත පරිදි වගා ඉඩම් සඳහා ලබා දීම • තෝරා ගත් ඇල මාර්ග වල ස්ථායිතාවය වැඩි කිරීම			
අපේක්ෂිත පරිදී නිම කිරීමට නොහැකි වීමට හේතු	අධික වර්ෂාපතනය, ගංවතුර තත්ත්වය හා අක් මුදල් ප්‍රමාදයන්			

14. පොළොන්නරු දිස්ත්‍රික් වාරි සංවර්ධන ව්‍යාපෘතිය

ඇස්තමේන්තු ගත මුදල	රු.මි. 7,000	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	පොළොන්නරුව
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය	**ජලාශ ධාරිතාව / වගා භූමි ප්‍රමාණය**	අක්කර අඩි 351,700 (ජලාශ 04)
ව්‍යාපෘති කාලය	2016-2024	**ප්‍රතිලාභීන්**	පවුල් 29,790
කල් දිගු ලබාදීම්	-	**කල් දිගු ලබා දීමට හේතු**	-
ප්‍රතිපාදන 2024	රු.මි. 700	**2025 වසර සඳහා ප්‍රතිපාදන**	-
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි.2157.28	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	98.0
2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 680.35		
2024 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන / දරන ලද වියදම	• පරාක්‍රම සමුද්‍රයේ වැව් බැම්ම වැඩිදියුණු කිරීමේ ඉතිරි වැඩ • පොළොන්නරුව කොට්ඨාශයේ පරාක්‍රම සමුද්‍ර ව්‍යාපාරයේ D1 උතුර සහ නැගෙනහිර ඇලවල් වැඩිදියුණු කිරීම හා D1 ප්‍රධාන ඇල වැඩිදියුණු කිරීම • මින්නේරිය කොට්ඨාශයේ කවුඩුල්ල වාන් ඇල වැඩිදියුණු කිරීම (කහඹිලියා ඔය) • කවුඩුල්ල කොට්ඨාශයේ දම්සෝපුර FC 7 ඇල වැඩිදියුණු කිරීම • කවුඩුල්ල කොට්ඨාශයේ පහත් මට්ටම් ප්‍රධාන ඇල වැඩිදියුණු කිරීම • කවුඩුල්ල කොට්ඨාශයේ අඹගස්වැව ව්‍යාපාරයේ ඇලවල් වැඩිදියුණු කිරීම • කවුඩුල්ල කොට්ඨාශයේ බෙබියාවැව FC 09 ඇල වැඩිදියුණු කිරීම • පොළොන්නරුව කොට්ඨාශයේ D2 ප්‍රධාන ඇල වැඩිදියුණු කිරීම • මින්නේරිය ජලාශයේ රජඇල සොරොව් දොරටුව ප්‍රතිසංස්කරණය කිරීම • කවුඩුල්ල කොට්ඨාශයේ බෙබියාවැව ප්‍රධාන ඇල වැඩිදියුණු කිරීම	රු.මි. 680.358
2025 වසර සඳහා යෝජිත වැඩසටහන	-		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• පොළොන්නරුව දිස්ත්‍රික්කයේ යල කන්නයේ ජල හිඟය අවම කිරීම සහ ජල සැපයුමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම. • ඊසානදිග මෝසම් වර්ෂා කාලයේදී ගංවතුර හේතුවෙන් කුඹුරුවලට සිදුවන හානිය අවම කිරීම		
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	පසුගිය වසරේ යල සහ මහ කන්නය සඳහා ගොවි පවුල් 8,316 ක් සඳහා වාරි පහසුකම් ලබාදීම		
අපේක්ෂිත පරිදි නිම කිරීමට නොහැකි වීමට හේතු	2024 වර්ෂයේ ඉදිකිරීම් කාලය තුළ ඇතිවූ අධික වර්ෂාපතනය සහ ගංවතුර තත්වයන්		
අභියෝග	• ඉදිකිරීම් කටයුතු සඳහා අමුද්‍රව්‍ය ලබා ගැනීමට අපහසු වීම • අනපේක්ෂිත කාලගුණික තත්ත්වය		

වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වෙන වෙනත් ව්‍යාපෘති

1. බස්නාගොඩ ජලාශ ව්‍යාපෘතිය

ඇස්තමේන්තු මුදල	මුල් ඇස්තමේන්තු මුදල රුපියල් මිලියන 2,347+ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද මිල විවලනය IPC 21 දක්වා රුපියල් මිලියන 1,085	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	ගම්පහ
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය (චීන EXIM බැංකුවෙන් ණය ආධාර යටතේ)	**ජලාශ ධාරිතාව / වගා භූමි ප්‍රමාණය**	ඝන මීටර මිලියන 5.5
ව්‍යාපෘති කාලය	2019-2025	**ප්‍රතිලාභීන්**	පවුල් 250,000
ප්‍රතිපාදන 2024	සිදු කරන ලද කාර්යය මත පදනම්ව ගෙවීම	**2025 වසර සඳහා ප්‍රතිපාදන**	සිදු කරන ලද කාර්යය මත පදනම්ව ගෙවීම
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	ඇස්තමේන්තුව අනුව ගෙවීම රු.මි.1,642 ක් හා මිල විවලනය සඳහා ගෙවීම රු.මි.1085 කි. ඒ අනුව මුළු මුදල රු.මි.2,727 කි.	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	81
2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	නිම කරන ලද වැඩ සඳහා ගෙවීම රු.මි.259 කි. මිල විවලනය සඳහා ගෙවීම රු.මි.1085 ක් වන අතර මුළු මූල්‍ය ප්‍රගතිය රු.මි. 1,344 කි		
2024 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන / දරන ලද වියදම	• ඉඩම් අත්පත් කර ගැනීමේ ඉතිරි කාර්යයන් • ජලාශ බැම්ම සහ අනෙකුත් ව්‍යුහයන් ඉදි කිරීම • ස්ථීර මාර්ග ඉදි කිරීම හා පාලම් ඉදි කිරීම		
2025 වසර සඳහා යෝජිත වැඩසටහන	ඉතිරි ඉදිකිරීම් අවසන් කර 2025 ජුනි මස වන විට ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීම.		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	ගම්පහ, අත්තනගල්ල මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය (GAMIWSS) යටතේ ගම්පහ දිස්ත්‍රික්කයට පානීය ජලය සැපයීම.		
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	සැලසුම් ධාරිතාව දිනකට ඝන මීටර් 54,000 පරීක්ෂා කිරීමෙන් පසු ව්‍යාපෘතියේ වර්තමාන ඉල්ලුම සපුරාලීම සඳහා ජලය සැපයීම		
අපේක්ෂිත පරිදී නිම කිරීමට නොහැකි වීමට හේතු	• ඉඩම් අත්පත් කර ගැනීමේ ගැටලුව, කොවිඩ් වසංගතය සහ ඉදිකිරීම් ද්‍රව්‍ය හා ඉන්ධන හිඟය. • 2023 සහ 2024 තුළ පැවති අයහපත් කාලගුණික තත්ත්වය. • මුදල් ගෙවීම් සම්බන්ද ගැටළු		
අභියෝග	• අසාමාන්‍ය කාලගුණික තත්ත්ව • අමුද්‍රව්‍ය මිල ඉහල යාම		

2. ඒකාබද්ධ ජලධාර හා සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP)

ඇස්තමේන්තු මුදල	රු.මි. 4,463.00	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	මුලතිව්, යාපනය සහ කිලිනොච්චිය හැර දිස්ත්‍රික්ක 22 කි
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ලෝක බැංකුව	**ජලාශ ධාරිතාව / වගා භූමි ප්‍රමාණය**	වාරිමාර්ග යෝජනා ක්‍රම 20 ක් ප්‍රතිසංස්කරණය කිරීම සහ දිස්ත්‍රික්ක 22 ක තුල වාරිමාර්ග උප පද්ධතියේ අත්‍යවශ්‍ය සහ හදිසි පුනරුත්ථාපන කටයුතු සිදු කිරීම
ව්‍යාපෘති කාලය	2021 – 2026	**ප්‍රතිලාභීන්**	අදාළ ගොවි සංවිධානයන් හි සියලුම සාමාජිකයින් සහ එම යෝජනා ක්‍රම යටතේ ප්‍රතිලාභ ලබන අනෙකුත් පාර්ශවකරුවන් සහ පරිශීලකයින්
ප්‍රතිපාදන 2024	රු.මි. 2,795.00	**2025 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 2,500.00
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 1,961.00	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	70
2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 1,226.00		
2024 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන / දරන ලද වියදම	• පැකේජ දහයකින් ප්‍රධාන පැකේජ හයක් සම්පූර්ණ කර ඇති අතර, ප්‍රධාන පැකේජවල සමස්ත භෞතික ප්‍රගතිය 87% කි. මෙම පැකේජවල සිදු කර ඇති කාර්යයන් කිහිපයක් නම්, - මූලස්ථායි වැඩ වැඩිදියුණු කිරීම් - ඇල මාර්ග වැඩිදියුණු කිරීම් වැඩ අයිතම 383 කින් වාරිමාර්ග උප පද්ධතියේ අත්‍යාවශ්‍ය සහ හදිසි පුනරුත්ථාපන කටයුතු 383 ම අවසන් කර ඇති අතර එම අයිතමවල සමස්ත භෞතික ප්‍රගතිය 100% කි.		
2025 වසර සඳහා යෝජිත වැඩසටහන	I අදියරේදී ප්‍රධාන පැකේජවල 100% භෞතික ප්‍රගතියක් සහ II අදියරේදී ප්‍රධාන පැකේජවල 40% භෞතික ප්‍රගතියක් ලබා ගැනීම.		
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• දැනට පවතින වාරි වේලි ශක්තිමත් කිරීම (වේලි -10) • වාරිමාර්ග යෝජනා ක්‍රමවල ඇළ පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම (ඇල මාර්ග - 12) • ව්‍යාපෘතිය යටතේ වැඩිදියුණු කරන ලද වේලි සඳහා අවදානම් තක්සේරු කිරීම් සිදු කිරීම. • කාර්යක්ෂම වාරි කළමනාකරණයට පහසුකම් සැලසීම, ගොවි ප්‍රජාවගේ හැකියාවන් ශක්තිමත් කිරීම සහ ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා ක්‍රියාකාරී සහභාගීත්වය වැඩි දියුණු කිරීම. • සේනානායක සමුද්‍රයේ වැඩිදියුණු කිරීම් සඳහා පුළුල් අධ්‍යයනයක් පැවැත්වීම.		

සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	• පවතින වාරි වේලි ශක්තිමත් කිරීම (පළමු අදියර යටතේ භෞතික ප්‍රගතියෙන් 81%ක් ලබා ගෙන ඇත) • වාරිමාර්ග යෝජනා ක්‍රමවල ඇළ මාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම (I අදියර යටතේ භෞතික ප්‍රගතියෙන් 100%ක් ලබාගෙන ඇත) • වැඩ අයිතම 383 න් වාරිමාර්ග උප පද්ධතියේ අත්‍යාවශ්‍ය සහ හදිසි පුනරුත්ථාපන කටයුතු 383 ම නිම කර ඇත.
අපේක්ෂිත පරිදී නිම කිරීමට නොහැකි වීමට හේතු	• අධික වර්ෂාපතනය හේතුවෙන් දිගු කාලයක් වැව්වල ඉහළ ජල මට්ටමක් පැවතීම. • වගා කාලසටහනට සමාන්තරව සියලුම පුනරුත්ථාපන කටයුතු සිදු කිරීම. • තාක්ෂණික කාර්ය මණ්ඩල හිඟය • දෙපාර්තමේන්තුව මගින් අඩු කාර්ය මණ්ඩලයක් සහිතව ව්‍යාපෘති කිහිපයක් සමාන්තරව ක්‍රියාත්මක කිරීම.
අභියෝග	• වැඩ සඳහා ඇස්තමේන්තු වසර කිහිපයකට පෙර සකස් කර තිබුණි. එබැවින් සමහර ඇස්තමේන්තු සංශෝධනය කරන ලදී. • අඩු කාර්ය මණ්ඩලයකින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම. • එකම කාර්ය මණ්ඩලය සමඟ වෙනත් ව්‍යාපෘති සහ අනෙකුත් දෙපාර්තමේන්තු කටයුතු ක්‍රියාත්මක කරන අතරතුර මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම. • කාර්ය මණ්ඩලය සඳහා කිසිදු දිරිදීමනාවක් නොමැතිව ව්‍යාපෘති කටයුතු සිදු කිරීම.

3. දේශගුණික අවබලපෑම් - බහු පියවර වැඩසටහන් ක්‍රියාමාර්ග ප්‍රවේශය (CResMPA)

ඇස්තමේන්තු මුදල	ඇ.ඩො.මි. 17	**ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක**	සියලුම දිස්ත්‍රික්ක (25)
මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය	ශ්‍රී ලංකා ජනරජය / ලෝක බැංකුව	**ජලාශ ධාරිතාව / වගා භූමි ප්‍රමාණය**	හෙක්ටයාර 21,000
ව්‍යාපෘති කාලය	2022-2025	**ප්‍රතිලාභීන්**	336,337
ප්‍රතිපාදන 2024	රු.මි. 4,000	**2025 වසර සඳහා ප්‍රතිපාදන**	රු.මි. 2,000
සමුච්චිත මූල්‍ය ප්‍රගතිය	රු.මි. 2,117.42	**සමස්ථ භෞතික ප්‍රගතිය (%)**	74
2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය	රු.මි. 1,752.94		
2024 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන / දරන ලද වියදම	2024 වර්ෂයේදී 56% ක භෞතික ප්‍රගතියක් ලබා ඇත.		
2025 වසර සඳහා යෝජිත වැඩසටහන	2025 ජූලි මාසය වන විට ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම.		

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ	• දිවයින පුරා පුද්ගලයින් 336,337 ක් සඳහා ප්‍රතිලාභ ලබා දීම. • හෙක්ටයාර 21,000 ක භූමි ප්‍රදේශයකට වාරි ජලය සැපයිය හැකි වීම. • ඇළ මාර්ග කි.මී. 99.14ක් වැඩිදියුණු කිරීම
සමස්ථ ප්‍රතිලාභයෙන් මේ වන විට ලබා ඇති ප්‍රතිලාභ	• දිවයින පුරා පුද්ගලයින් 179,524ක් සඳහා ප්‍රතිලාභ ලබා දීම. • හෙක්ටයාර 14,385 ක භූමි ප්‍රදේශයකට වාරි ජලය සැපයීම • ඇළ මාර්ග කි.මී. 38.89 ක් වැඩිදියුණු කිරීම
අපේක්ෂිත පරිදී නිම කිරීමට නොහැකි වීමට හේතු	• අනපේක්ෂිත වැසි රටාව • ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියේ දීර්ඝ ක්‍රියාවලිය සහ ගෙවීම් ප්‍රමාදය.
අභියෝග	• තාක්ෂණික කාර්ය මණ්ඩලයේ හිඟය • ආකෘති නිතිපතා වෙනස් කිරීම • පළාත් වාරිමාර්ග හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වැනි අනෙකුත් දෙපාර්තමේන්තු කටයුතු හැසිරවීම. • පවතින කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාව වැඩි කිරීමට දිරිගැන්වීමක් නොමැති වීම. • ජේෂ්ඨ කාර්ය මණ්ඩලය සඳහා පවතින ඉන්ධන සීමාවන්

2.2 අභියෝග

- අක්මුදල් ලැබීමේ නිර්නායකයන්ට අනුකූලව, වාර්ෂික ඉලක්ක ළඟාකර ගැනීමට සැලසුම් සකස් කිරීම.
- ඉන්ධන ඇතුළු ඉඳිකිරීම් ද්‍රව්‍ය ණය පදනම මත ලබාගැනීමේ අපහසුව සහ එමගින් අපේක්ෂිත කාලවකවානු තුල ඉඳිකිරීම් අවසන් කිරීම.
- ඉංජිනේරු සේවයේ වැඩි ප්‍රතිශතයක් විදේශ රැකියා සඳහා යොමුවීමත්, එම පුරප්පාඩු සම්පූර්ණ නොකිරීම හා නව බඳවා ගැනීම් සිදු නොකිරීම නිසා ක්ෂේත්‍ර මට්ටමේ රාජකාරි සඳහා අවශ්‍ය වන වාරිමාර්ග ඉංජිනේරුවරුන් 50%ක් පමණ සක්‍රීය සේවයෙන් බැහැරගොස් සිටීම සහ එම හිඟ නිලධාරීන්ගේද සේවය ආවරණය කරමින් රාජකාරී කිරීමට සිදුවීම.
- ක්ෂේත්‍රයේ තාක්ෂණික කටයුතු ඉටු කිරීමට අවශ්‍ය වන ඉංජිනේරු සහකාර සේවයේ නිලධාරීන්ගේ හිඟතාවය සහ ඒ වෙනුවට අලුතින් නිලධාරීන් බඳවා නොගැනීම.
- ක්ෂේත්‍රයේ රාජකාරී කටයුතු නිරන්තර අධීක්ෂණය යටතේ සිදුකල යුතු වුවත් විටින් විට පනවනු ලබන චක්‍රලේඛ විධිවිධාන මගින් අවබලපෑම් සිදුවීම හා ඒ අනුව සැළසුම් කල ප්‍රගතිය ලබාගත නොහැකි වීම.
- වසරේ අගභාගයේ දීර්ඝකාලයක් තුල පැවති අනපේක්ෂිත අධික වර්ෂාපතනය නිසා උතුරු නැගෙනහිර ඇතුළු බොහෝ ප්‍රදේශ වල වගාවන්ට සහ නිර්මිතවලට ගංවතුරින් හානි සිදුවීම.
- රටතුල පැවති ආර්ථික අර්බුදය නිසා RAMP හා NOR (ජාතික මෙහෙයුම් මැදිරිය) කමිටු තීරණ අනුව සංවර්ධන යෝජනා ක්‍රම තාවකාලිකව නැවැත්වීමට සිදුවීම.
- අයතා මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් ජලාශ, වැව්, පොකුණු, ගංගා සහ ස්වභාවික ජල මාර්ගවල ගුණාත්මකභාවයට සිදුවන බලපෑම අවම කිරීම.
- දේශගුණික විපර්යාසවල බලපෑම් සමඟ වාරිමාර්ග යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම.
- ගංවතුර හා නියඟ අවම කිරීම සඳහා නව ජලාශ ඉදිකිරීමට අවශ්‍ය වන ඉඩම් නිදහස් කර ගැනීමේ අපහසුතාවය සහ අවතැන්වන පුද්ගලයන් සඳහා නව ඉඩම් ලබා දීම.
- වගා තිව්‍රතාවය වැඩි කිරීම සහ වෙනත් ක්ෂේත්‍ර භෝග අවශ්‍යතාවයන්ගෙන් ස්වයංපෝෂිතභාවය ළඟා කර ගැනීම සඳහා භෝග වගා කිරීම පිළිබඳ ආකල්පය වෙනස් කිරීමට ගොවිමහත්වරුන් දක්වන ප්‍රතිරෝධය.
- වගා ඉඩම් වල ඵලදායිතාව වැඩි දියුණු කිරීම (නව ජල කළමනාකරණ ක්‍රමවේදයන් සහ බෝග විවිධාංගීකරණය කිරීමෙන් පවතින ජලයෙන් උපරිම භූමි ප්‍රමාණයක් වගා කිරීම)
- ක්ෂේත්‍ර කාර්යමණ්ඩලයේ හිඟතාවය සහ ඇල මාර්ග නිරන්තර ප්‍රතිසංස්කරණයට ලක් නොකිරීම නිසා ඇල මාර්ග වල මුල් කොටසේ මෙන්ම අග කොටසේද වගා කටයුතු කරන ගොවීන් සඳහා සමාන ජල ප්‍රමාණයන් ලබා දීම.
- ක්ෂේත්‍ර මට්ටමේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් නිසි අධ්‍යනයකින් තොරව අදාළ ක්ෂේත්‍ර කටයුතු භාර ආයතන මගින් විමසීමකින් තොරව පොදුවේ නිකුත් කරනු ලබන භාණ්ඩාගාර චක්‍රලේඛන හා මූල්‍ය රෙගුලාසි.
- ජලාශවල හා වාරිමාර්ග ඇළ මාර්ගවල පැතිරී ඇති ආක්‍රමණශීලී ජලජ ශාක පාලනය කරමින් මනා ජල කළමනාකරණයක් සිදු කිරීම.
- තථ්‍ය කාලීන ජලමිතික දත්ත කළමනාකරණ පද්ධතියේ නඩත්තු කටයුතු හා අලුත්වැඩියාවන් සිදු කර ගැනීමේ දුෂ්කරතා.
- ජීවිත සහ දේපළවලට සිදුවන හානිය අවම කරමින් හැකි ඉක්මනින් ගංවතුර බැස යාමට පහසුකම් සැලසීම සඳහා නාගරික ප්‍රදේශවල ඇති සියලුම ජලාපවහන ඇල මාර්ග සුද්ද කිරීම සහ ඇතැම්

ඇල මාර්ග අවහිර වන සේ ඉදිකර ඇති අනවසර ඉදිකිරීම් ඉවත් කර නියමිත ප්‍රමිතියට පවත්වාගන යාම.

- අනවසරයෙන් අල්ලාගෙන සිටින රක්ෂිත ඉඩම් නිදහස් කර ගැනීම, රක්ෂිත ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය ඉඩම් සහ අනෙකුත් පාරිසරික සංවේදී ප්‍රදේශ අත්පත් කර ගැනීම සහ එවැනි රක්ෂිත ආරක්ෂා කිරීම.
- ජල කළමනාකරණය සඳහා නව තාක්ෂණයන් යොදා ගැනීම සහ යාවත්කාලීන කර පවත්වාගැනීම සඳහා අවශ්‍ය පුහුණු මානව සම්පත් හිඟවීම
- ගංගා පතුළ මට්ටම පහත වැටීම හේතුවෙන් ප්‍රධාන ගංගාවලට ලවණතාව ඇතුළු වීම වැළැක්වීම.
- මහා පරිමාණ , නීති විරෝධී, තාක්ෂණික නොවන වැලි සහ වෙනත් කැණීම් වලින් ගංගා සහ ගංගා අවට ප්‍රදේශ ආරක්ෂා කර ගැනීම.
- ජලය හා සම්බන්ධ මූලික අයිතිය ආරක්ෂා කරමින් වාරිමාර්ග ජල අවශ්‍යතා සපුරාලමින් පානීය හා කාර්මික ජල අවශ්‍යතා සැපයීම.
- අයතා මිනිස් ක්‍රියාකාරකම් වලින් ජල මාර්ග ආරක්ෂාකර ගැනීම.

2.3 ඉදිරි ඉලක්ක

- ප්‍රධාන වාරිමාර්ග ව්‍යාපාර වල කුඹුරු අක්කරයක් වගා කිරීම සඳහා යොදාගන්නා ජල ප්‍රමාණය 2027 වන විට මහ කන්නයේ අක්කර අඩි 3.5 සිට 3.3 දක්වාත් යල කන්නයේදි අක්කර අඩි 4.8 සිට 4.6 දක්වාත් අඩු කිරීම.
- ප්‍රධාන වාරිමාර්ග ජලාශවල ධාරිතාව 2027 වන විට ඝණ මීටර් මිලියන 20 කින් වැඩි කිරීම.
- වාරිමාර්ග ව්‍යාපාරවල යල කන්නයේ වගා තීව්‍රතාවය 2027 වසර වන විට 85% දක්වාත් මහ කන්නයේ වගා තිව්‍රතාවය 96% දක්වාත් වැඩි කිරීම.
- ඉදිරි සිව් වසරක කාලය තුල නව කුඹුරු හෙක්ටයාර් 5,000 ක් සඳහා වාරි ජල පහසුකම් ලබාදීම.
- ගංවතුර ආපදා අවම කරගැනීම සඳහා පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියට දත්ත ලබාගැනීම සඳහා 2027 වන විට දත්ත ලබාගැනීමේ ස්ථාන සංඛ්‍යාවට තවත් මධ්‍යස්ථාන 100 ක් එකතු කිරීම.

ඉංජී. අජිත් ගුණසේකර
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්

ඉංජී. අජිත් ගුණසේකර
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්
වාරිමාර්ග දෙපාර්තමේන්තුව
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

පරිච්ඡේදය 03 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

3.1. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසිඒ-එෆ්

2024 දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 රු.		සටහන	තත්‍ය 2024 රු.	- 2023 රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	**1**	-	-	ඒසිඒ-**1**
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		18,209,704,000	12,544,614,380	ඒසිඒ-**3**
-	තැන්පතු		4,510,108,447	2,333,711,038	ඒසිඒ-**4**
-	අත්තිකාරම් ගිණුම්		220,321,153	208,090,577	ඒසිඒ-**5**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**22,940,133,600**	**15,086,415,995**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**22,940,133,600**	**15,086,415,995**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		370,031,510	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		**22,570,102,090**	**15,086,415,995**	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
3,894,421,302	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	3,690,876,903	3,123,316,413	ඒසිඒ-**2(ii)**
758,118,698	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	660,055,792	581,490,812	
14,400,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	11,682,360	14,117,993	
-	පොළී ගෙවීම්	**8**	-	-	
550,000	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	550,000	-	
4,667,490,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**4,363,165,055**	**3,718,925,218**	

	මූලධන වියදම්				
5,746,100,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	5,384,892,665	1,940,290,403	
17,553,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	7,577,874,798	3,364,701,548	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	-	-	ඒසිඒ-**2(ii)**
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
9,400,000	හැකියා වර්ධනය	**14**	7,293,840	5,086,567	
121,000,000	වෙනත් මූලධන වියදම්	**15**	78,168,248	3,400,614,743	
23,429,500,000	**මුළු මූලධන වියදම් (ඇ)**		**13,048,229,551**	**8,710,693,261**	
	තැන්පතු ගෙවීම්		4,469,271,367	2,156,094,910	ඒසිඒ-**4**
	අත්තිකාරම් ගෙවීම්		286,144,200	234,405,726	ඒසිඒ-**5**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (උ)		4,755,415,567	2,390,500,636	
	මුළු වියදම් එ = (ඊ+ඇ+උ)		22,166,810,173	14,820,119,115	
28,096,990,000	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		**403,291,917**	**266,296,880**	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		399,883,573	266,296,880	ඒසිඒ-**7**
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		3,408,344	-	ඒසිඒ-**3**
			403,291,917	**266,296,880**	

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පී

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	2024 රු.	2023 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	1,537,555,855,163	110,269,782,100
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	673,262,525	607,439,479
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**1,538,229,117,688**	**110,877,221,579**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(34,098,911)	(55,676,533)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		1,537,555,855,163	110,269,782,100
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසිඒ-5(බී)**		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	703,953,092	663,116,012
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	3,408,344	-
මුළු වගකීම්		**1,538,229,117,688**	**110,877,221,579**

පිටු අංක 6 සිට 45 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 46 සිට 91 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම **රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16** දිනැති **රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024** විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 2025/02/25

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍යාංශය

.....
ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 2025/02/25
ඉංජි. අජිත් ගුණසේකර
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්
වාරිමාර්ග දෙපාර්තමේන්තුව
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 2025/02/24
එන්.ආර්.ඒ.පී. රණතුංග
ප්‍රධාන මූල්‍ය නිලධාරි
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට
වාරිමාර්ග දෙපාර්තමේන්තුව
කොළඹ 07.

3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
	2024	**2023**
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	331,116,691	239,749,764
අග්‍රිම ලැබීම්	18,209,704,000	12,544,614,380
අත්තිකාරම් අයකර ගැනීම්	219,803,564	199,494,143
තැන්පතු ලැබීම්	4,510,108,447	2,332,717,437
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**23,270,732,702**	**15,316,575,724**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	4,337,043,355	3,691,092,760
සහනාධාර සහ මාරුකිරීම්	11,682,360	14,117,993
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	888,182,717	531,546,261
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	370,031,510	-
අත්තිකාරම් ගෙවීම්	287,111,975	233,909,290
තැන්පතු ගෙවීම්	4,469,271,367	2,156,094,910
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**10,363,323,284**	**6,626,761,214**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**12,907,409,418**	**8,689,814,510**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වියදම්	12,904,001,074	8,689,814,510
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**12,904,001,074**	**8,689,814,510**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(12,904,001,074)**	**(8,689,814,510)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**3,408,344**	**-**

මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**3,408,344**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**3,408,344**	**-**

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

<u>වාර්තාකිරීමේ පදනම</u>

1. වාර්තාකරණ කාලපරිච්ඡේදය

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2. මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3. ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4. දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5. දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6. මුදල් හා මුදල් සමාන දෑ

2024 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘති වල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම වාර්ථාකරණ පදනම යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
අදාළ නොවේ					

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
පුනරාවර්තන	4,683,990	4,667,490	4,363,165	93.48
ප්‍රාග්ධන	23,413,000	23,429,500	13,048,230	55.69

3.7. මු.රෙ. **208** ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණු	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
1	පරිසර අමාත්‍යාංශය	සුවදායි භූමි දර්ශන ව්‍යාපෘතිය හා මවු ආර යෝජනා ක්‍රමයේ ගොඩබිම් ඇළ ඇළ මාර්ගය කොන්ක්‍රීට් ආස්තරණය	18,576	18,576	18,140	98%
2	කෘෂිකර්ම දෙපාර්තමේන්තුව	අම්බලන්තොට වී පර්යේෂණ ආයතනයේ පර්යේෂණ ප්‍රදේශයට අයත් වාරිමාර්ග ඇළ මාර්ගයේ කොන්ක්‍රීට් ආස්තරණය	400	400	400	100%
3	ආරක්ෂක අමාත්‍යාංශය	ආපදා අවම කිරීමේ ව්‍යාපෘතියේ කටයුතු	12,298	12,298	12,297	100%

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු.

වත්කම් කේතය	කේත විස්තරය	**2023.12.31** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**2023.12.31** දිනය මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යූහයන්	2,542,268,236.24	2,542,268,236.24	-	100%
9152	යන්ත්‍රෝපකරණ	5,634,293,835.80	5,634,293,835.80	-	100%
9153	ඉඩම්	1,529,182,609,546	1,529,182,609,546	-	100%
9154	අස්පෘශ්‍ය වත්කකම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වත්කම්	196,683,544.84	196,683,544.84	-	100%
9180	බදු දෙන ලද වත්කම්			-	-

3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව

ඇමුණුම 1

පරිච්ඡේදය 04 : කාර්යසාධන දර්ශක

4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	90% - 100%	**75% - 89%**	**50% - 74%**
වාර්ෂික වගා කාර්යසාධනය	90%		
භෞතික ප්‍රගතිය			58%
මුල්‍ය ප්‍රගතිය			57% (බැරකම් හැර)

පරිච්ඡේදය 05 : තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1. හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

ඉලක්කය / අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය (%)		
			0 - 49	**50 - 74**	**75 - 100**
ජලාශවල ධාරිතාවය වැඩිකිරීම	ඝණ මීටර් මිලියන 1,000කින් 2030 වර්ෂයේදී	වැඩි වූ ධාරිතාවය	26%		
වගා තිව්‍රතාවය වැඩි කිරීම	වර්ෂ 2030 දී 1.8 දක්වා වැඩිකිරීම	වගා තිව්‍රතාවය			100%
වාරි ව්‍යාපාර යටතේ ඇති වපසරිය වැඩි කිරීම	වර්ෂ 2030 දී අක්කර 150,000 කින් වැඩි කිරීම	වගා කළ ඉඩම් ප්‍රමාණය	30%		

5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග:

ජයග්‍රහණ

1. ජලාශවල ධාරිතාව 2018 සිට ඝන මීටර කියුබ් මිලියන 216.7 කින් වැඩි විය.
2. 2018 සිට දැනට පවතින වගා බිම් හා නව වගා බිම් හෙක්ටයාර 18,200 සඳහා වාරිමාර්ග පහසුකම් සැපයීමට හැකිවිය.
3. වාර්ෂික බෝග තීව්‍රතාව 1.80 ක් ලෙස වැඩිකිරීමට හැකිවී ඇත.

අභියෝග

- රටේ පවතින මුල්‍යමය තත්වය මත ඇතැම් ජලාශ ඉදිකිරීම තාවකාලිකව අත්හිටවීම නිසා ජලාශවල ධාරිතාවය ඉහළ නැංවීම සහ නව වගා බිම් සංවර්ධනය කිරීමට අපහසු වීම.
- පාරිසරික සහ සමාජීය ගැටලු හේතුවෙන් නව ජලාශ ඉදිකිරීම සඳහා සීමාවන් පවතී.
- පාරිසරික ගැටළු හේතුවෙන් නව ඉඩම් සඳහා වාරි පහසුකම් සැපයීම සීමා කිරීම.

- කන්නයක් තුළ 90%ට වැඩි බෝග තීව්‍රතාවය පවත්වා ගැනීම, ගංවතුර ඇතිවීම සහ කාලගුණික රටාවන් මත බෙහෙවින් රඳා පවතී.

පරිච්ඡේදය 06 : මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු/ (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	437	306	131
තෘතීයික	153	27	126
ද්විතීයික	2719	2206	513
ප්‍රාථමික	3510	2784	726

6.2. ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න

දෙපාර්තමේන්තුවෙහි මානව සම්පත් හිඟයක් පවතින අතර එය ආයතනයෙහි කාර්ය සාධනය සඳහා සෘජුවම බලපානු ලබයි.

- දෙපාර්තමේන්තුවේ ඉලක්කගත ප්‍රගතිය ළඟා කර ගැනීමට නොහැකි වීම.
- රාජකාරී කටයුතු නියමිත දිනයන්ට ආවරණය කර ගැනීමේදී දුෂ්කරතාවයන්ට මුහුණපෑමට සිදුවීම.
- වැඩ බැලීම සහ ආවරණයකර කිරීම මත නිලධාරීන් පත්කිරීම හේතුවෙන් අමතර වියදමක් දැරීමට සිදුවීම.
- පවතින මානව සම්පත් හිඟය හේතුවෙන් මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් ඇතුළු කාර්යාල කාර්ය මණ්ඩලය, අමතර අතිකාල හා නිවාඩු දින වැටුප් මත සේවයේ යෙදවීමට සිදුවීම.

6.3. මානව සම්පත් සංවර්ධනය

පැවැත් වූ විභාග

අනු අංක	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම
				දේශීය	විදේශීය		
1	කණිෂ්ඨ කාර්මික විභාගය (ප්‍රායෝගික)	ඉංජිනේරු සහකාරවරුන් -07 ක්	2024/01/30 සිට 2024/02/03	107.95		දේශීය (විභාගය)	දෙපාර්තමේන්තු නිලධාරීන් වෙනුවෙන් කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම හා දෙපාර්තමේන්තුව වෙනුවෙන් බඳවාගැනීම් විභාග පැවැත්වීම
2	ජ්‍යෙෂ්ඨ කාර්මික විභාගය (ප්‍රායෝගික)	ඉංජිනේරු සහකාරවරුන් -25 ක්	2024/05/06 සිට 2024/05/11	199.86		දේශීය (විභාගය)	
3	දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය	II ශ්‍රේණියේ ඉංජිනේරු සහකාරවරුන් -01 ක්	2024/06/04	5.35		දේශීය (විභාගය)	
4	පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය	I ශ්‍රේණියේ ඉංජිනේරු සහකාරවරුන් -04 ක්	2024/06/28	12.45		දේශීය (විභාගය)	
5	පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය	III ශ්‍රේණියේ තාක්ෂණ සහායකවරුන් - 19 ක්	2024/07/26	8.42		දේශීය (විභාගය)	
6	ජ්‍යෙෂ්ඨ කාර්මික විභාගය (ලිඛිත)	I ශ්‍රේණියේ ඉංජිනේරු සහකාරවරුන් - 298 ක්	2024 ඔක්තෝබර් 19/20/26/27	1653.13		දේශීය (විභාගය)	
7	තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය	ඉංජිනේරු සහකාරවරුන් -05 ක්	2024/11/26	18.67		දේශීය (විභාගය)	
8	එක් අවුරුදු පුහුණුව අවසන් කිරීම	සැලසුම්ශිල්පීන් - 20 ක්	2024/11/29	18.54		දේශීය (විභාගය)	
9	දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය	II ශ්‍රේණියේ ඉංජිනේරු සහකාරවරුන් -01 ක්	2024/12/13	4.50		දේශීය (විභාගය)	

පශ්චාත් උපාධි පාඨමාලා 2024

අනු අංක	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම
				දේශීය	විදේශීය		
1	පාරිසරික අධ්‍යයනය පිළිබඳ විද්‍යාපති උපාධිය	වා. ඉං - 01ක්	වසර 2	67.85	-	දේශීය	විද්‍යාපති උපාධිය
2	මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය	ගණකාධිකාරීවරුන් 03 ක්	වසර 2	223.50	-	දේශීය	විද්‍යාපති උපාධිය
3	භූ තොරතුරු පිළිබඳ විද්‍යාපති උපාධිය	වා. ඉං - 01ක්	වසර 2	120.00	-	දේශීය	විද්‍යාපති උපාධිය
4	භූ තොරතුරු පිළිබඳ විද්‍යාපති උපාධිය	පා.ස.ඉං -02 ක්	වසර 2	240.00	-	දේශීය	විද්‍යාපති උපාධිය
5	ව්‍යුහාත්මක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය	වා. ඉං - 01ක්	වසර 2	228.50	-	දේශීය	විද්‍යාපති උපාධිය
6	රාජ්‍ය ප්‍රසම්පාදන හා සැපයුම් දාම කළමණාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය	වා. ඉං - 01ක්	වසර 2	261.30	-	දේශීය	විද්‍යාපති උපාධිය

දෙමළ භාෂා පුහුණු පාඨමාලාව 2024

අනු අංක	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම
				දේශීය	විදේශීය		
1	1	පැය 150 සිංහල භාෂා පාඨමාලා	ඉං.ස/ සං.නි/ ක.සේ.නි/ තා.ස/ ජ.ස/ ජ.ක්ෂේ.ස/ ප.සේ/ ග.හා - 50 ක්	මාස 5	112.50	-	දේශීය
2	2	පැය 100 දමිළ භාෂා පාඨමාලාව	කා.කා.ස/ රියදුරු/ කම්කරු - 73ක්	මාස 5	75.00	-	දේශීය
3	3	පැය 100 දමිළ භාෂා පාඨමාලාව	කා.කා.ස/ රියදුරු/ කම්කරු - 48ක්	මාස 3	75.00	-	දේශීය
4	4	පැය 200 දමිළ භාෂා පාඨමාලාව	වා.ඉං/ ප.නි/ නේ. ඉං/ යා.ඉං - 30ක්	මාස 4	150.00	-	දේශීය
5	සිංහල භාෂා පුහුණු පාඨමාලාව (පැය -150)	65 – (ඉ.සං./ සං.නි./ කළ.සේවා නි./ තා.ස./ ජල විද්‍යා සහකාර / ජල විද්‍යා ක්ෂේත්‍ර සහකාර/පර්යේෂණ සහකාර / ගබඩා භාරකරු)	මාස - 4	112,5	-	දේශීය	සිංහල භාෂා පුහුණුව

විදේශීය පුහුණු වැඩසටහන්

අනු අංක	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම
				දේශීය	විදේශීය		
1	ITEC- ගොවි සමූහ සහ ඔවුන් වෙළඳපළට සන්ධානය කිරීම පිළිබඳ වැඩසටහන	ඉංජිනේරු සහකාරවරුන් - 04	දින 12	131.016	ITEC විසින් ආධාර පිරිනමන ලදී.	ඉන්දියාවේ විදේශ පුහුණුව	ගොවි සමූහ සහ ඔවුන් වෙළඳපළට සන්ධානය කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන
2	ඕස්ට්‍රේලියානු ප්‍රධාන අධිශිෂ්‍යත්ව (AAF) වැඩසටහන- ආයතනික මට්ටමෙහි පවතින දේශගුණික විපර්යාස ප්‍රත්‍යාස්ථිතිය සඳහා මූලපිරීම ප්‍රජා මට්ටමට ගෙන යාම සම්බන්ධීකරණය.	ඉංජිනේරුවරුන් - 02	දින 21	123.454	ඕස්ට්‍රේලියාවේ විදේශ කටයුතු හා වෙළඳ දෙපාර්තමේන්තුව විසින් ආධාර පිරිනමන ලදී	ඕස්ට්‍රේලියාවේ විදේශ පුහුණුව	ආයතනික මට්ටමෙහි පවතින දේශගුණික විපර්යාස ප්‍රත්‍යාස්ථිතිය සඳහා මූලපිරීම ප්‍රජා මට්ටමට ගෙන යාම සම්බන්ධීකරණය පිළිබඳ පුහුණු වැඩසටහන
3	ITEC -ප්‍රවාහ මැනීම සහ පාලනය, ජල බෙදා හැරීමේ පද්ධතිය සඳහා ශිල්පීය ක්‍රම	පර්යේෂණ සහකාරවරුන්- 03	දින 23	95.298	ITEC විසින් ආධාර පිරිනමන ලදී	ඉන්දියාවේ විදේශ පුහුණුව	ප්‍රවාහ මැනීම සහ පාලනය, ජල බෙදා හැරීමේ පද්ධතිය සඳහා ශිල්පීය ක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහන
4	ITEC -ස්වභාවික උරුම කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	ඉංජිනේරුවරුන්- 01	දින 25	61.300	ITEC විසින් ආධාර පිරිනමන ලදී	ඉන්දියාවේ විදේශ පුහුණුව	Hydro SOS ක්‍රියාතමක කිරීමේ සැලසුම් වැඩමුළුව පිළිබඳ පුහුණු වැඩසටහන
5	AIBO -සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ඉදිකිරීම් අංශයේ EPC ව්‍යාපෘතියේ සමස්ත ක්‍රියාවලි ඉංජිනේරු උපදේශන කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය.	ඉංජිනේරුවරුන්- 02	දින 16	120.244	AIBO විසින් ආධාර පිරිනමන ලදී	චීනයේ විදේශ පුහුණුව	AIBO සමුළුවට සහභාගී විම
6	28 වන දුරස්ථ සංවේදනය හා භූගෝලීය තොරතුරු පද්ධති පිළිබඳ ප.උ පාඨමාලාව-CSSTEAP – දුරස්ථ සංවේදනය පිළිබඳ ඉන්දියානු ආයතනය (IIRS), ඉන්දියාව	ඉංජිනේරු සහකාරවරුන් -01	මාස 09	-	CSSTEAP විසින් ආධාර පිරිනමන ලදී.	ඉන්දියාවේ විදේශ පුහුණුව	දුරස්ථ සංවේදනය හා භූගෝලීය තොරතුරු පද්ධති පිළිබඳ ප.උ පාඨමාලාව
7	"හරිත මූල්‍ය සහ තිරසාර සංවර්ධනය: දකුණු ආසියාවේ ඉදිරි දර්ශන" පිළිබඳ සමුළුව	ඉංජිනේරුවරුන් - 01	දින 3	-	දකුණු ආසියානු අධ්‍යයන මධ්‍යස්ථානය විසින් ආධාර පිරිනමන ලදී	නේපාලයේ විදේශ පුහුණුව	"හරිත මූල්‍ය සහ තිරසාර සංවර්ධනය: දකුණු ආසියාවේ ඉදිරි දර්ශන" පිළිබඳ සමුළුවට සහභාගී වීම

අනු අංක	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම
				දේශීය	විදේශීය		
8	ගංගා ද්‍රෝණි උපාය මාර්ගය මත පදනම්ව දේශීය ආපදා අවදානම් අවම කිරීමේ සැලසුම් ස්ථාපිත කිරීම තුළින් ආපදා අවදානම් අවම කිරීම ප්‍රධාන ප්‍රවාහයට ගෙන ඒම සඳහා වන ව්‍යාපෘතිය පිළිබඳ පුහුණුව.	ඉංජිනේරුවරුන්-01	දින 16	59.042	JICA විසින් ආධාර පිරිනමන ලදී	ජපානයේ විදේශ පුහුණුව	ආපදා අවදානම් අවම කිරීම ප්‍රධාන ප්‍රවාහයට ගෙන ඒම සඳහා වන ව්‍යාපෘතිය පිළිබඳ පුහුණුව.
9	ඕස්ට්‍රේලියානු ප්‍රදාන දකුණු ආසියාව හා මොන්ගෝලියාව: ඒකාබද්ධ ගංගා ද්‍රෝණි කළමනාකරණයේ ධාරිතා වර්ධන වැඩසටහන (නේපාලය)	ඉංජිනේරුන් -01	දින 15	59.042	ඕස්ට්‍රේලියානු රජය විසින් ආධාර පිරිනමන ලදී	ඕස්ට්‍රේලියාවේ විදේශ පුහුණුව	ඒකාබද්ධ ගංගා ද්‍රෝණි කළමනාකරණයේ ධාරිතා වර්ධන වැඩසටහන පිළිබඳ පුහුණුව
10	KOM27 සම්මන්ත්‍රණ මධ්‍යස්ථානයේදී "කුසගින්නට එරෙහි ප්‍රතිපත්ති" පිළිබඳ සම්මන්ත්‍රණය	ඉංජිනේරුවරුන් -01	දින 06	-	ගෝලීය ආහාර හා කෘෂිකාර්ම සංසදය විසින් ආධාර පිරිනමන ලදී	ජර්මනියේ විදේශ පුහුණුව	"කුසගින්නට එරෙහි ප්‍රතිපත්ති" පිළිබඳ සම්මන්ත්‍රණයට සහභාගී වීම
11	B&R (Belt and Road) රටවල් සඳහා වැසි ජලය රැස් කිරීම සහ භාවිතය පිළිබඳ පුහුණු පාඨමාලාව	ඉංජිනේරුවරුන් -02	දින 20	300.475	චීන රජය විසින් ආධාර පිරිනමන ලදී	චීනයේ විදේශ පුහුණුව	වැසි ජලය රැස් කිරීම සහ භාවිතය පිළිබඳ පුහුණු පාඨමාලාව
12	සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා හදිසි සෝදිසි සහ මුදාගැනීම පිළිබඳ සම්මන්ත්‍රණය	ඉංජිනේරුවරුන් -02	දින 17	290.322	චීන රජය විසින් ආධාර පිරිනමන ලදී	චීනයේ විදේශ පුහුණුව	සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා හදිසි සෝදිසි සහ මුදාගැනීම පිළිබඳ සම්මන්ත්‍රණයට සහභාගී වීම
13	කාලගුණ විද්‍යා නිරීක්ෂණ, කාලගුණ අනාවැකි සහ කාලගුණ රේඩාර් අනතුරු ඇඟවීම් නිකුත් කිරීමේ ධාරිතා වර්ධනය සඳහා වන ව්‍යාපෘතිය පිළිබඳ JICA ප්‍රතිපාර්ශ්වික පුහුණුව	ඉංජිනේරුවරුන් -01	දින 13	100.775	JICA විසින් ආධාර පිරිනමන ලදී	ජපානයේ විදේශ පුහුණුව	JICA ප්‍රතිපාර්ශ්වික පුහුණුව
14	2024 මූල්‍ය වර්ෂය සඳහා ජපන් මානව සම්පත් සංවර්ධන ශිෂ්‍යත්වය (JDS) - ශාස්ත්‍රපති උපාධි වැඩසටහන	ඉංජිනේරුවරුන් -01	වසර 02 මාස 01 දින 10	-	JDS විසින් ආධාර පිරිනමන ලදී	ජපානයේ විදේශ පුහුණුව	ශාස්ත්‍රපති උපාධි වැඩසටහන
15	ජපානයේ දුරස්ථ සංවේදන තාක්ෂණ මධ්‍යස්ථානය විසින් පවත්වන ලද 16 වන ආසියා-ඕෂනියා පෘථිවි නිරීක්ෂණ කණ්ඩායම් (AOGEO) සම්මන්ත්‍රණය	ඉංජිනේරුවරුන් -01	දින 05	-	AOGEO දෙපාර්තමේන්තුව විසින් ආධාර පිරිනමන ලදී	ජපානයේ විදේශ පුහුණුව	සම්මන්ත්‍රණයට සහභාගී වීම

අනු අංක	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම
				දේශීය	විදේශීය		
16	ජල ගැටළු විසඳීම සඳහා ප්‍රායෝගික ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණය (IWRM))	ඉංජිනේරුවරුන් - 01ක්	මාස 01 දින 04	145.102	JICA විසින් ආධාර පිරිනමන ලදී	ජපානයේ විදේශ පුහුණුව	ජල ගැටළු විසඳීම සඳහා ප්‍රායෝගික IWRM පිළිබඳ පුහුණු වැඩසටහන
17	සෙන්දායි රාමුගත සම්මුතිය ක්‍රියාත්මක කිරීම සඳහා ආපදා අවදානම් අවම කිරීමේ (DRR) නායකත්ව ධාරිතා සංවර්ධනය (JFY 2024)	ඉංජිනේරුවරුන් - 01	වසර 02	107.686	JICA විසින් ආධාර පිරිනමන ලදී	ජපානයේ විදේශ පුහුණුව	ශාස්ත්‍රපති උපාධි වැඩසටහන
18	HMIS මධ්‍යස්ථානවල ස්වයංක්‍රීය උපකරණ අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම සඳහා අමතර කොටස් ප්‍රසම්පාදනය සහ සැපයීම සඳහා වන කොන්ත්‍රාත්තු කොන්දේසි වලට අනුකූලව කර්මාන්තශාලා නැවිගත කිරීම සඳහා පෙර පරීක්ෂාව.	ඉංජිනේරුවරුන් - 02	දින 05	10.00	IWWRMP විසින් ආධාර පිරිනමන ලදී	ජර්මනියේ කර්මාන්තශාලා පරීක්ෂාව	කර්මාන්තශාලා පරීක්ෂාව
19	වේගවත් ගංවතුර පුහුණුව සහ ආකෘති සංවර්ධනය පිළිබඳ සහභාගී වීම සහ සම්බන්ධීකරණය සඳහා ආරාධනාව	ඉංජිනේරුවරුන් - 01	දින 9	-	ජාතික ආහාර වැඩසටහන විසින් ආධාර පිරිනමන ලදී	නෙදර්ලන්තයෙන් විදෙස් ආරාධනාව	ආරාධනාව
20	2024 දෙසැම්බර් 12 සිට 14 දක්වා තායිලන්තයේ පැවති 19 වන INWEPF ධාවක කමිටු රැස්වීම සහ සම්මන්ත්‍රණය	ඉංජිනේරුවරුන් - 01	දින 05	-	INWEPF විසින් ආධාර පිරිනමන ලදී	තායිලන්තයේ විදෙස් රැස්වීම	රැස්වීමට සහභාගී වීම
21	ශ්‍රී ලංකා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සඳහා ජනක යන්ත්‍ර සැපයීම සහ ස්ථාපනය කිරීම සඳහා කර්මාන්තශාලා පිළිගැනීමේ පරීක්ෂණය.	ඉංජිනේරුවරුන් - 01	දින 08	-	CResMPA විසින් ආධාර පිරිනමන ලදී	ප්‍රංශයේදී කර්මාන්තශාලා පිළිගැනීමේ පරීක්ෂණය	ප්‍රංශයේ කර්මාන්තශාලා පිළිගැනීමේ පරීක්ෂණයට සහභාගී වීම

දේශීය පුහුණු වැඩසටහන් 2023

අනු අංක	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම
				දේශීය	විදේශීය		
1	AFOLU අංශයේ අනෙකුත් ඉඩම් පරිහරණ කාණ්ඩ සහ දත්ත සැකිලි සහ දත්ත සැපයීමේ මාර්ගෝපදේශ සඳහා ධාරිතා වර්ධන වැඩසටහන.	වා. ඉං 02	දින 01	-	-	පරිසර අමාත්‍යාංශය විසින් පවත්වන ලද දේශීය පුහුණු වැඩසටහන.	දැනුම වර්ධනය වීම
2	ICT ශාඛාව විසින් පවත්වන ලද සං.නි/ ක.ස සඳහා පරිගණක පුහුණු වැඩසටහන.	සං.නි/ ක.ස. - 05	දින 05	21.10	-	දේශීය පුහුණු වැඩසටහන	දැනුම වර්ධනය වීම
3	" වැඩ කොන්ත්‍රාත්තු හා සම්බන්ධ සහ ඒවා කළමණාකරණය කරන රාජ්‍ය හා පෞද්ගලික අංශයේ නිලධාරීන් වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක් අවශ්‍ය වන්නේ මන්ද? මන්ද යත්, රජයේ හා පෞද්ගලික අංශයේ කොන්ත්‍රාත්තු වල හිමිකම්, ගැටළු, ප්‍රමාදයන්, ආරවුල්, ප්‍රායෝගික නොවන පිරිවිතර, නීත්‍යානුකූල නොවන ප්‍රකාශ ඛණ්ඩයන්, විනිශ්චයන්, සමථකරණයන් වළක්වා ගැනීම සඳහා ය, " පිළිබඳ පුහුණුව	වා.අ/ප්‍ර.ඉං/ වා.ඉං- 05	දින 01	25.00	-	ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් පවත්වනු ලැබූ දේශීය පුහුණු වැඩසටහන	දැනුම වර්ධනය වීම
4	වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වාරිමාර්ග කාර්යය සහායකවරුන් සඳහා පුහුණු වැඩසටහන	වාරිමාර්ග කාර්යය සහායකවරුන් -70	දින 01	14.00	-	පුහුණු අංශය හා පාලන ඒකකය විසින් පවත්වනු ලැබූ දේශීය පුහුණු වැඩසටහන	දැනුම වර්ධනය වීම
5	GIS Solution (Pvt) Ltd විසින් පවත්වනු ලැබූ ArcGIS මෘදුකාංග පිළිබඳ පුහුණු වැඩසටහන.	වා. ඉං / ඉං.ස /ප.ස /ජ.ස -07	දින 05	-	-	GIS Solution (Pvt) Ltd විසින් පවත්වනු ලැබූ දේශීය පුහුණු වැඩසටහන	දැනුම වර්ධනය වීම
6	සංවර්ධන නිලධාරීන් සහ කළමනාකරණ සහායකවරුන් සඳහා පරිගණක සාක්ෂරතා කෙටි පාඨමාලාව. IWWRMP විසින් පවත්වන ලදී.	සං.නි/ ක.ස. - 10	මාස 04	-	-	වාරිමාර්ග අමාත්‍යාංශය විසින් පවත්වනු ලැබූ දේශීය පුහුණු වැඩසටහන	දැනුම වර්ධනය වීම

අනු අංක	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම
				දේශීය	විදේශීය		
7	වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාරවරුන් සඳහා සංස්කරණ පුහුණු වැඩසටහන	ඉංජිනේරු සහකාරවරුන් -250	දින 06	34.49	-	පුහුණු අංශය විසින් පවත්වනු ලැබූ දේශීය පුහුණු වැඩසටහන	දැනුම වර්ධනය වීම
8	රජයේ පාර්ශවකරුවන් සඳහා පූර්වාරක්ෂණ ක්‍රියාමාර්ග පුහුණුව (Anticipatory action training)	වා.ඉං/ පා.ස.ඉං -02	දින 01	-	-	RWP RSP VSV USP MM HDMC PSC විසින් පවත්වනු ලැබූ දේශීය පුහුණු වැඩසටහන	දැනුම වර්ධනය වීම
9	වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ විශ්‍රාම වැටුප් සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුව	සං.නි/ ක.ස – 77	දින 01	37.10	-	පුහුණු අංශය හා පාලන ඒකකය විසින් පවත්වනු ලැබූ දේශීය පුහුණු වැඩසටහන	දැනුම වර්ධනය වීම
10	NVQ ක්‍රමය පිළිබඳ පුහුණු වැඩසටහන	ප්‍ර.ඉං - 01	දින 01	-	-	තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පවත්වනු ලැබූ දේශීය පුහුණු වැඩසටහන	දැනුම වර්ධනය වීම
11	ඉංජි. මයුරන් මාර්කන්ඩුගේ පර්යේෂණ මාතෘකා සහ සොයාගැනීම් සාකච්ඡා කිරීම සඳහා අන්තර්ක්‍රියාකාරී සැසිය.	වා.අ/ ප්‍ර.ඉං/ වා.ඉං. / ඉං.ස / සං.නි- 22	දින 01	5.05	-	දේශීය පුහුණු වැඩසටහන	දැනුම වර්ධනය වීම
12	වාරිමාර්ග ඉංජිනේරුවරුන් සඳහා තාක්ෂණික හා කළමනාකරණ කුසලතා වැඩිදියුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන	ප්‍රා.වා.ඉං/ වා.ඉ / පා.ස.ඉං- 31	දින 05	519.22	-	ගල්ගමුව වාරිමාර්ග පුහුණු ආයතනය විසින් පවත්වනු ලැබූ දේශීය පුහුණු වැඩසටහන	දැනුම වර්ධනය වීම
13	වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සැලසුම්ශිල්පීන් (සීමිත) සඳහා සංස්කරණ පුහුණු වැඩසටහන.	සැලසුම්ශිල්පීන් -20	දින 02	18.54	-	ගල්ගමුව වාරිමාර්ග පුහුණු ආයතනය විසින් පවත්වනු ලැබූ දේශීය පුහුණු වැඩසටහන	දැනුම වර්ධනය වීම
14	JICA තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘතිය මගින් පවත්වනු ලැබූ ඵලදායී රාජ්‍ය ආයෝජන කළමනාකරණය සඳහා ධාරිතා සංවර්ධනය	වා.අ/ ප්‍ර.ඉං-05	දින 03	-	-	JICA තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘතිය මගින් පවත්වනු ලැබූ දේශීය පුහුණු වැඩසටහන	දැනුම වර්ධනය වීම
15	පුද්ගලික ලිපිගොනු කළමණාකරණය සඳහා පුහුණු වැඩසටහන	සං.නි/ ක.සේ.නි / ප.නි – 115	දින 01	3.94	-	දේශීය පුහුණු වැඩසටහන	පුද්ගලික ලිපිගොනු කළමණාකරණය පිළිබඳ දැනුම වර්ධනය වීම

පරිච්ඡේදය 07 : අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
01	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	-		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	-		
1.6	වෙනත්	-		
02	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/ 2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙළ කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	සිහි කැඳවීම් ලිපි යැවීම් මගින් පිළිතුරු ලබා ගැනීම	විගණන කළමනාකරණ රැස්වීමේදී සාකච්චා කිරීම.

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උපවගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණක වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණ කමිටු**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ	විශාල වාහන ප්‍රමාණයක් ඇති බැවින් ඒවා පිළිබඳ තොරතුරු ලබාගෙන අපහරණ වාහන හඳුනාගැනීමේ පරීක්ෂණ මණ්ඩල කලාප වශයෙන් පත්කර එම වාර්තාවලට අනුව නැවතත් තක්සේරු මණ්ඩල පත්කර ලබාගත් වාර්ථා සඳහා වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම්තුමාගේ අනුමැතිය ලබාගැනීමට ලතවන කාලය මාස 06 ට වඩා වැඩි වේ	දෙපාර්තමේන්තුව සතු වාහන අපහරණය කිරීමේදී සියළුම වාහන එකවර අපහරණ කටයුතු නොකර අපහරණ ලේඛන සූදානම් කර නිම වන පිළිවෙලට අවස්ථා කිහිපයක් යටතේ එම වාහන සඳහා අපහරණ අනුමැතිය ලබා ගෙන අපහරණයට යොමු කිරීම.
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල නොවේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
17.2	ආයතනය පිළිබඳව තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම			
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම.	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම.	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම.	2023.11.30 දිනැති රා.ප.ව. 2/2018 (i)මගින් කාර්යසාධන ගිවිසුම් ලබා දීම අවශ්‍ය නොවන බවට උපදෙස් ලබා දී ඇත.		

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම			
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		